**<u>2023.01.13 දින පෙ.ව. 09.00 ට බෙන්තොට ප්‍රාදේශීය සභා හබුරුගල උපකාර්යාල රැස්වීම් ශාලාවේදී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.</u>**

සහභාගිත්වය :-

| | | |
|---|---|---|
| 1. පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා | - | ගරු සභාපති |
| 2. ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා | - | ගරු උප සභාපති |
| 3. එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4. හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 5. ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 6. එම්. වී. නිලුක එරන්ද ගුණසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 7. කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 8. දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 9. කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඩී. ඩී. ගංගා කුමාරි විජේවර්ධන මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 12. පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 14. පී. එල්. සෝමසිරි මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 16. පී. ලෙනිකා දූෂාන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 17. එච්. ඩී. එච්. නදීකා විජේරත්න මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 18. ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 19. පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 20. එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 21. එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 22. අස්වින් මනුරංග සමරනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 23. ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 24. එම්. ජේ. නිරෝෂන් මුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

**1. <u>පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම</u>.**

**1.1. 2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ගරු සභාපති සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.**

**<u>සංශෝධන අංක 01- ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**

2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 3හි ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමාගේ අදහස් දැක්වීමේ දී ඇතුළත්, "මෙවැනි අර්බුධකාරී කාලයක අයවැයක් නිර්මාණය කිරීම අපහසුයි." යන්න වෙනුවට "නිවසේ අයවැයක්වත් නිර්මාණය කිරීමට අපහසු අර්බුදකාරී කාල පරිච්ඡේදයක අයවැය නිර්මාණය කිරීම පහසු කාර්යයක් නොවුවද අභියෝගයන්ට මුහුණ දී සිදුකල යුතු දෙයක්" යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>සංශෝධන අංක 02- ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**
2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 13හි ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමාගේ අදහස් දැක්වීමේ දී "මල්මඩුවාකන්ද පෙර පාසල නිරීක්ෂණය කර ලබා ගන්නා ලද ඡායාරූප මෙම අවස්ථාවේදී සභා ගත කරන ලදී."යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>සංශෝධන අංක 03- ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංශෝධන</u>**
2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ පිටු අංක 21හි ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමාගේ යථා පරිදි කල් දී නොමැති යෝජනා අංක 5.5.38 හි ඇතුළත්, "දෝපේ කඩියන්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීම දෝපේ සමෘද්ධි සමිතිය මඟින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි." යන්න වෙනුවට "දෝපේ කඩියන්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි" යන්න ඇතුළත් කර සංශෝධනය විය යුතු බව ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 09.05 ට ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

**2. <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-</u>** කිසිවක් නොමැත.

**3. <u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම</u> :-**

3.1. "පෞද්ගලික ඉඩමේ වසා තිබූ කාණු පද්ධතිය විවෘත කිරීම සම්බන්ධවයි" යන මැයෙන් යුතුව අංක 269/සී, ගල්බඩ, ඉඳුරුව ලිපිනයේ පදිංචි ටී.ඩබ්. ආනන්ද විසින් එවන ලද 2022.10.24 දිනැති ලිපිය ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

3.2. "කැඩී අබලන් වී ඇති බෝක්කුවක් පිළිසකර කිරීම සම්බන්ධයෙනි" යන මැයෙන් යුතුව නො.483, අතුරුවැල්ල, ඉඳුරුව ලිපිනයේ පදිංචි බී.ඩී.චන්දන ප්‍රභාත් යන අය විසින් 2023.01.03 දිනැති ලිපිය ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

3.3. "සිල්වර් ගාඩ්න් සිරිසිසිලස ආරාමය විහාරස්ථානය පිළිබඳ" යන මැයෙන් යුතුව සිල්වර් ගාඩ්න් සුභ සාධක සමිතිය විසින් 2023.01.12 දිනැති ලිපිය ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 09.10 ට ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

**4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> :-** කිසිවක් නොමැත.

**5. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u> :-**

**<u>5.1. ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.1.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වාර්ෂික ඉදිරි සංවර්ධන සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ තිරසාර සංවර්ධන සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කරන ලෙස තීරණය විය.

5.1.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සිව් අවුරුදු සැලැස්ම (2023 -2026) සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කරන ලෙස තීරණය විය.

5.1.3. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ (2023 – 2026) කසළ කළමනාකරණ හා පරිසර කටයුතු පිළිබඳ සැලැස්ම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කරන ලෙස තීරණය විය.

5.1.4. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පවත්නා සේවා අවශ්‍යතාවයන් සලකා බලා ආදේශක පදනමින් මුරකරු තනතුරු 01ක්ද, අනියම් පදනමින් මුරකරු තනතුරු 01ක් හා ආදේශක පදනමින් පුස්තකාල සහයක තනතුරු 02ක් සඳහා සේවයට බඳවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. වී. නිලුක එරන්ද ගුණසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. චක්‍රලේඛ, අණපනත් සම්බන්ධයෙන් සැලකිලිමත් වීමට මැතිවරණ කොමසාරිස්තුමා මාධ්‍ය නිවේදනයක් නිකුත් කර තිබෙනවා. වක්‍රාකාරයෙන් පක්ෂයක් හෝ පුද්ගලයකු ප්‍රවර්ධනය වීමක් සිදුවිය හැකියි.

**<u>ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා</u>**
මේ සම්බන්ධයෙන් කොමසාරිස්තුමාගේ අනුමැතිය ගෙන ඉදිරි මහ සභාවට ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රී එච්.ඩී. දිලාන් මධුරංග මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, මැතකාල පරිච්ඡේදය තුලත් දේශපාලන අධිකාරිය මඟින් තනතුරු සඳහා බඳවාගනු ලබනවා. ඔවුන් විශ්‍රාම වැටුප පිළිබඳ හා රාජ්‍ය ආයතනයන්ගේ ඇති ප්‍රතිලාභ ගැන සිතා දේශපාලනයට කරන උදව් නිසා, මෙම ස්ථානවලට පැමිණ තවමත් ස්ථිර නොවූවන් කීදෙනෙක් මෙහි සිටිනවාද?

- මෙම අවස්ථාවේ සභාවේ ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

එම යෝජනාවට අනුව කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ඉදිරි සභාවට ඉදිරිපත් කරන ලෙස ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 09.20 ට ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය හා ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

5.1.5. ‘‘බෙන්තොට රවුම්පාර රජ මාවත, යනුවෙන් නම් කිරීම සම්බන්ධවයි’’ යන මැයෙන් යුතුව බෙන්තොට ඓතිහාසික ගලපාත රජමහා විහාරස්ථානයේ සම්පාදක, විහාරාධිපති පූජ්‍ය සීගිරියේ අනෝම හිමිගේ හා ශ්‍රී අනුබුද්ධ මහා කාශ්‍යප පූජෝපහාර සමිතියේ සභාපතිගේ 2022.12.08 දිනැති ලිපියට අනුව ඓතිහාසික ගලපාත රජමහා විහාරස්ථ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ වැඩසිටින විහාරස්ථානය මුල් කරගනිමින් පරිවාර රජ මහා විහාරස්ථාන වන වනවාස රජමහා විහාරස්ථානය, බෝධිමළුව රජ මහා විහාරස්ථානය, බෙන්වෙහෙර රජ මහා විහාරස්ථානය (ගනේ රජ මහා විහාරස්ථානය), උඩකොටුව බෝධි සමීප රජ මහා විහාරස්ථාන යන පංච මහා විහාර වටා ඇති රවුම් පාර පෙර සිට භාවිතාවන පරිදිම ‘‘රජ මාවත’’ යනුවෙන් නම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඩබ්.ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
මෙම පාර දැනට හඳුන්වන නම මොකක්ද?

**<u>ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, මෙම ස්වාමීන්වහන්සේගේ ඉල්ලීම මම ස්ථිර කරනවා. දැනට පවතින නම ‘‘රවුම්පාර’’ හෙවත් ‘‘සර්කල් රෝඩ්’’ ලෙසයි. වරිපනම් ලේඛනවල සහ සියළු තැන්වල මෙම මාර්ගය සඳහන් වන්නේ රවුම්පාර නමිනි. 1997 නම් තැබීමේ ප්‍රශ්නයක් ඇති වුනා. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පාරවල් සඳහා පළමු පටුමඟ, දෙවන පටුමඟ ලෙස නම් කිරීමට හෝ රජ වරුන්ගේ නම් දැමීමටයි. නමුත් මෙම නම් දැමීම නතර වුනා. ඉන්පසු සභාවේ ‘‘සරත් ජයසේකර මාවත’’ ලෙස නම් කිරීමට යෝජනා කලත් එම බෝඩ් එක ගැලෙව්වා. පෙරහැර පවත්වන දිනයේදී ස්වාමීන් වහන්සේ විසින් රජ මාවත ලෙස නම් කිරීමට ආරාධිත අමුත්තාගෙන්ද ඉල්ලීමක් කලා.

**<u>ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා අවසරයි. මීට පෙර මෙම පාර ‘‘සරත් ජයසේකර මාවත’’ ලෙස නම් කිරීමට යෝජනාවක් තිබුණා. ජයසේකර මැතිතුමාට ගරු කරනවා. අප බල ප්‍රදේශයේ වටිනාම අනුබුදු කාශ්‍යප මහරහතන් වහන්සේගේ දළදා වහන්සේගේ පූජෝපහාර මංගල්‍යය පවත්වන වටරවුම රජ මාවතයි. ගලපාත රජමහා විහාරය මෙම රටේ බැබළෙනවාද බෙන්තරත් ඒ ආකාරයටම බැබළෙනවා. දොළොස්වන සියවසේ සිට ඉතිහාසයේ ‘‘රජ මාවත’’ ලෙස නම භාවිතා කර තියෙනවා. උන්වහන්සේ ගෙනා යෝජනාව නිවැරදියි. මෙහි නීත්‍යානුකූල තත්ත්වය පිළිබඳව දන්නේ නැහැ. නමුත්, මෙම මාවතට රජ මාවත ලෙස නම් කරනවානම් විදේශිකයන්ට පුරාවෘත්තයක් සහිත රජවරු සිටි ප්‍රදේශයක් ලෙස හඳුන්වා දෙන්න පුළුවන්. මෙම සිද්ධස්ථාන හා ඊට අදාළවන භෞතික අංගයක් තුළින්ම විදේශිකයන් දකින්නේ ඓතිහාසික ගම් ප්‍රදේශයක් ලෙසයි. මෙමගින් සංචාරක ක්ෂේත්‍රයටත් ශක්තියක් එකතුවෙනවා. පෞද්ගලිකව බල ප්‍රදේශයේ ජනතා නියෝජිතයකු ලෙස, මෙම ‘‘වටරවුම් පාර’’ ලෙස නොව ‘‘රජ මාවත’’ ලෙස නම් කරනවානම් හොඳයි යන්න ප්‍රකාශ කරනවා.

<u>**ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා**</u>
මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ කතාබහට ලක්වුනා. සරත් ජයසේකර මැතිතුමාව ගෞරවයක් ලෙස සභාව විසින් වෙනත් සුදුසු ප්‍රධාන පාරක් යෝජනා කර නම් කරමු. රජ මාවත ලෙස නම් කිරීමත් සමඟම ඓතිහාසික වටිනාකමක් ඇති වෙනවා. අටමස්ථානවලට අමතරව රජමහා විහාර කිහිපයක් සහිත ප්‍රදේශය බෙන්තරයි. ජයසේකර මැතිතුමාට තම දේශපාලන ගෞරවය වශයෙන් වැදගත් ස්ථානයක් නම් කිරීමට ලබා දිය යුතුයි.

<u>**ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා**</u>
මීට පෙර මෙම මාර්ගයට යෝජනාවක් ගෙනාවා. එම නිසා මේ සඳහා තවත් යෝජනාවක් ගේන්න බැහැ. මේ සම්බන්ධයෙන් ස්වාමීන් වහන්සේ දැනුවත් කරන්න. ගරු අධිකරණයට ගොස් එම යෝජනාව ඉවත් කර ඉන් අනතුරුව මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්න. මෙම මාර්ගයට නම යෝජනා කරන්න හේතුව, වටරවුම් පාර ලෙස නම්කරලා තිබුණේ. කිසිම කෙනෙකු මෙම පාරට නමක් යෝජනා කලේ නැති නිසා යෝජනාවක් ලෙස මාගේ පියාගේ නමින් පාර නම්කිරීමට තීරණය කලේ. මෙය පළාත් සභාවට යොමු කර ස්ථිර වුනා. මෙම මාර්ගයට රජ මාවත ලෙස නම් කලාට ප්‍රශ්නයක් නැහැ. නමුත්, මෙහි ක්‍රමවේදයක් තිබෙනවා. එම ක්‍රමවේදය අනුව සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. මගේ පියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් ජීවිතය පිදූ නිසා රවුම්පාරට නමක් නොතිබූ නිසාත් පාරක් නම්කිරීමට යෝජනා කලා. මගේ පියාගේ සොහොන තිබෙන්නෙත් එම මාර්ගයේමයි. ආරච්චිමුල්ල කෝම්මල මාර්ගය පියාගේ නමින් නම් කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා**</u>
වෙනමම යෝජනාවක් ලෙස ලිඛිතව සභාවට ඉදිරිපත් කරන්න.

<u>**ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා**</u>
ගරු සභාපතිතුමා සභාව මඟින් නම් යෝජනා කිරීම කරන්න එපා යැයි තීරණය කර තිබුනද, නම් යොදා පාරවල් නම් කර තිබෙනවා. සභාවෙන් හදන ලද මාර්ග සඳහා විවිධ පුද්ගලයින් විසින් පුද්ගලික නම් යොදා තිබෙනවා.

<u>**ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා**</u>
ගිනිගලවත්ත පාර සොයා ගැනීමේ ප්‍රශ්නයක් තියෙනවා යැයි එම ප්‍රදේශයේ ජනතාව ඉල්ලීමක් කලා. පාරක් හඳුන්වාදීමට නමක් දැමූවිට සොයා ගැනීමට පහසුයි.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 09.30 ට ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

5.1.6. “ප්‍රධාන මාර්ගයේ ඇති අනවසර වැව්ලි සහ කුණු ඉවත්කරවා ගැනීම” යන මැයෙන් යුතුව ගෝනගලපුර, ගල්තුඩුව, නො. 363 ලිපිනයේ පදිංචි විරාජ් එරන්ද රංචාගොඩ විසින් 2022.03.22 දින යොමු කරන ලද මහජන පැමිණිල්ල අනුව එම මහතාගේ නිවස ඉදිරිපිට දිවෙන මාර්ග රක්ෂිතයේ කොටසක අනවසරයෙන් කෙසෙල් පැළ ඇතුළු වගාවන් සිදුකර ඇති බැවින්, සිටුවා ඇති වැව්ලි ඉවත් කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා</u>**
මෙය ප්‍රදේශීය ලේකම් සතු ඉඩමක්. පැමිණිලිකාර පුද්ගලයා උණ පඳුරක් හා මල් වැටක් සිටවා තිබෙනවා. රක්ෂිත කොටසේ ඇති කෙසෙල් ගස් ඉවත් කරන්න යැයි ඉල්ලා සිටිනවා. ඉවත් කරනවානම් රක්ෂිතයට අයත් සියළුම ගස් ඉවත් කල යුතුයි. මෙහි පවතින්නේ පුද්ගලික ප්‍රශ්නයක්. පාරේ ගමන්කරන ජනතාවට කිසිදු අවහිරයක් නැහැ.

**<u>ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
පාරට හානියක් නැත්නම්, කුණු ටික ඉවත් කර ගන්න කියන්න.

**<u>ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා</u>**
තියන කෙසෙල් ගස්වල කැන් ටික ආ පසු ඒවා ඉවත් කරන්නම් කියලා ඒ අය ප්‍රකාශ කලා. පෞද්ගලික තරහක් තියෙන්නේ. මම ඡන්දෙ ඉල්ලන කාලයේ සිටම මෙම ස්ථානයේ කෙසෙල් ගස් තිබුණේ. පාරට අවහිරයක් නැහැ.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා</u>**
ජනතාව පීඩාවට පත්වන්නේ නැත්නම් ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු  මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා</u>**
නැවත නැවතත් වගාවන් නොකරන්න යැයි ප්‍රාදේශීය සභාවෙන් ලිපියක් යවන්න පුළුවන්.

**<u>ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, මෙම කොළණිය ප්‍රදේශයේ පවතින්නේ ආණ්ඩුවෙන් බෙදා වෙන්කරන ලද ඉඩම්. අඩි 20ක පාරක් තිබුනද, සාමාන්‍යයෙන් සාදන්නේ අඩි 8 හෝ අඩි 10 පාරවල් වීම නිසා රක්ෂිත කොටසක් ලෙස ඉතිරි වෙනවා. අසල නිවෙස්වල ජනතාව එම රක්ෂිත කොටසෙහි වගා කටයුතු සිදු කරනවා. දැන් සිටින පරම්පරාවට කලින් පරම්පරාව මේ සම්බන්ධයෙන් දැනුවත්. ස්ථිර බෝග වවා නැහැ. මෙමඟින් මහජනතාවට හෝ මාර්ගයට කිසිදු අවහිරයක්, අනතුරක් සිදුවන්නේ නැහැ. වගාකරන පුද්ගලයින්ගේ නිවස පාරෙන් අනෙක්පස තිබෙන නිසා නිවසේ කුණු මෙම රක්ෂිත කොටසට දැමීමෙන් වළකින්න යැයි කිව යුතුයි. ස්ථිර වැවිලි නොකරන ලෙසටත් කුණු නොදමන ලෙසටත් දැනුවත් කරන්න. මෙය සභාවට අයිතියක් නැහැ. මෙහි නියම අයිතිකරු ප්‍රාදේශීය ලේකම්.

එම යෝජනාවට අනුව අදාළ මාර්ග රක්ෂිතය මාර්ගය භාවිතා කරන්නන්ට අවහිරයක් නොවන පරිදි කුණු දැමීමකින් හා ස්ථිර බෝග වගා කිරීමකින් තොරව පවත්වා ගැනීමටත් මෙම භූමිය රජයට අයත් භූමි කොටසක් බැවින් මේ සඳහා කිසිදු අයිතිවාසිකමක් ප්‍රකාශ කල නොහැකි බවත් සභාවට ඕනෑම අවස්ථාවක අදාළ වැවිලි බෝග ඉවත් කිරීමට හැකිබවත් යන කොන්දේසිවලට යටත්ව කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

5.1.7. 2012 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල සිටම 2015 වර්ෂය දක්වා කාලසීමාව තුළ අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිදු කරන ලද වර්ෂ අවසාන ගිණුම්වල නිරවුල් නොවූ ණය හිමි හා ණයගැති ශේෂ ලෙස සඳහන් වී පවතින කර්මාන්ත, වර්ෂ අවසාන ගිණුම් වලින් ඉවත් කිරිම සඳහා 2022.03.11 පැවති මහ සභාවේ තීරණ අංක 5.4.9 තීරණය ප්‍රකාරව මගේ අංක බෙප්‍රාස/සං/03/02/04/2018 හා 2022.03.16 දිනැති ලිපියට අනුව පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා තීරණයක් ගැනීමට 2022.06.10 දිනැති මාසික සභා රැස්වීමේ අනුමැතියට යොමු කල ද එහි දී මෙම කමිටු  වාර්තාවට අදාළ පරීක්ෂණ වාර්තාවක් පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින් ගෙන්වා ගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට  තීරණ අංක 5.1.2 යටතේ ඒකමතිකව සභා සම්මත විය. නමුත් මෙම ශේෂයන් පැරණි වටිනාකම් බැවින් නැවත ලබා නොදෙන

බැව් ද දන්වා ඇති බැවින් ද නැවත සභාවට යොමු කර තීරණයක් ගැනීමට කටයුතු කිරීම සුදුසු බව 2022.08.23 දින සහකාර විගණකාධිපතිගේ මූලිකත්වයෙන් පැවති විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී ද තීරණය වී ඇති බැවින් එම නිරවුල් නොවූ ණය හිමි හා ණයගැති ශේෂ වලට අදාල වාර්තාව ප්‍රකාරව අවසාන ගිණුම නිරවුල් කර ගැනීමට මෙම ශේෂ කපාහැරීමට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා තීරණයක් ගැනීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිර කරන ලද අතර, පොත් වලින් ශේෂ කපාහැරීමට ඒකමතිකව සභා සම්මත විය.

5.1.8. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු විෂය නිලධාරීන්හට ලිපිකරු මේස හා පුටු අවශ්‍ය බැවින් ලිපිකරු මේස 02 ක් හා ඇඳි සහිත පුටු 02ක් ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.1.9. දෝපේ කඩියන්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 132,621.46 ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, සංවර්ධන යෝජනා සිදුකිරීමට හැකියාවක් නැහැ නේද? මෙතෙක් කල් ඉදිරිපත් කරන ලද කිසිදු යෝජනාවකට විරුද්ධ වෙලා නැහැ. නමුත් මැතිවරණ කොමසාරිස්තුමා නිවේදනයක් නිකුත් කර තිබෙනවා. මෙම අවස්ථාවේදී සංවර්ධන යෝජනා හා ඇස්තමේන්තු ක්‍රියාත්මක කරන්න අයිතියක් නැහැ. යම්කිසි පක්ෂයක් නියෝජනය කරන මහජන නියෝජිතයකු විසින් කරනු ලබන යෝජනාවක්. යම් පක්ෂයක් නියෝජනය කරන මහජන නියෝජිතයෙක් දේශපාලනික වශයෙන් මෙම අවස්ථාවේදී රජයේ මුදල් අවභාවිතා කර සංවර්ධන යෝජනා කිරීම තුළින් පක්ෂයක් හෝ පුද්ගලයකු ප්‍රවර්ධනය කිරීමක් සිදුවෙනවා. ඒ හේතුවෙන් මෙම යෝජනාවන්ට මම විරුද්ධයි. ගරු සභාපතිතුමා, ඔබතුමාගේ පක්ෂයේ නාම යෝජනා අත්සන් කල මාධ්‍යවේදී මහත්මයෙක් අද දින සභාවට පැමිණ සිටිනවා. සභාවේ රැදී සිට වාර්තාකරණය සිදුකිරීමේදී පක්ෂග්‍රාහීව ඉදිරිපත් කරාවී යන හැඟීම දැනෙනවා. එසේ වාර්තා නොකරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, මැතිවරණ කොමසාරිස්තුමාට චක්‍රලේඛ නිකුත් කිරීමට බලතල තිබෙන්න පුළුවන්. මැතිවරණ කොමසාරිස්තුමාට හෝ මැතිවරණ කොමිසමට සංවර්ධන යෝජනා නවත්වන්න බැහැ. සභාවෙන් මෙම යෝජනා කරන්නේ මාස කිහිපයකට කලින්. අද ඉදිරිපත් කරන්නේ එහි ඇස්තමේන්තුවයි.

**<u>ගරු සභාපති පී.ඩී.සරත් ආනන්ද මැතිතුමා</u>**
සංවර්ධන කටයුතු නවත්තන්න යැයි කිසිම චක්‍ර ලේඛනයක් එවා නැහැ.

**<u>ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා</u>**
එසේනම්, හොරවල පාලමේ වැඩ නැවතුනේ ඇයි?

**<u>ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා</u>**
ඡන්දයක් ප්‍රකාශයට පත්කර තිබෙන කාල පරිච්ඡේදයක ප්‍රජාතන්ත්‍රවාදී රටක නිදහස් ඡන්දයක් ක්‍රියාත්මක වීමේදී එහි පුරුක් විදියට, මිනිසුන්ගේ පාරවල් සෑදීමෙන් මිනිසුන්ගේ හිත් දිනාගන්න ඔබතුමාලා සිතනවානම් ඉතාමත් වටිනවා.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, සභාව විසුරුවා හරින දිනයක්, මැතිවරණයට දිනයක් ප්‍රකාශ නොකර මැතිවරණයට නාම යෝජනා කැඳවීම සිදු කර ඇති මැතිවරණයක්. මැතිවරණය පවත්වන කාලය නිශ්චිත නැහැ. මන්ත්‍රීවරුන්ට දීමනාව ලබාදී මාස දෙකක් සභාව පවත්වාගෙන යාමක් වනවා. ඒ අනුව අවිනිශ්චිත දෙයක් පිළිබඳව සිතා සංවර්ධන කටයුතු සිදු කිරීම නවත්වන්න බැහැ. නීත්‍යානුකූලව මැතිවරණ දිනයක් ප්‍රකාශකර ප්‍රාදේශීය සභාව විසුරුවා හරින තෙක් සංවර්ධන කටයුතු සිදුකල යුතුයි.

**<u>ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා</u>**
නිපුන මන්ත්‍රීතුමාගේ තර්කයක් තියනවා. ඒ අනුව ඡන්දයක් පැවැත්වීමට තිබෙන මොහොතක මෙම ක්‍රියාව අල්ලසක් දීමක් ලෙස සැලකෙනවා. විසුරුවා හැරීමක් නොමැතිව ඡන්දයක් ප්‍රකාශයට පත්කිරීම මැතිවරණ කොමිසමේ වැරැද්දක්.

- මෙම අවස්ථාවේ සභාවේ ඝෝෂාකාරී තත්ත්වයක් ඇති විය.

මෙම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.ඩී. වානිකා නදීශානි මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

ඒ අනුව දෝපේ කඩියන්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 132,621.46 ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය ලබාදීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව, ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා, ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා, ගරු මන්ත්‍රීනී ඩී. ඩී. ගංගා කුමාරි විජේවර්ධන මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. එල්. සෝමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ජේ. නිරෝෂන් මුණසිංහ මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාවට විපක්ෂව, ගරු මන්ත්රීනී එච්. ඩී. එච්. නදීකා විජේරත්න මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාව සඳහා, ගරු මන්ත්‍රී හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. ලෙනිකා දුෂාන්ති මැතිතුමිය ඡන්දය දීමෙන් වැළකී සිටි අතර,

එම යෝජනාව අවස්ථාවේ, ගරු මන්ත්‍රීනී පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය, ගරු මන්ත්‍රී එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා මේ අවස්ථාව වනවිට සභාවට නොපැමිණෙන ලදී.

දෝපේ කඩියන්ගොඩ මාර්ගයේ ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 132,621.46 ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය ලබාදීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව ඡන්ද 16ක් ද, විපක්ෂව ඡන්ද 4 ක් ද, ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු 2 ක් ද, නොපැමිණි මන්ත්‍රීවරු 2ක් ද, සිටි අතර, ඒ අනුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

5.1.10. සූරියගම කොස්ගහතුඩුව අතුරු මාර්ග ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 200,000.00ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, මෙම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.ඩී. වානිකා නදීශානි මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

ඒ අනුව සූරියගම කොස්ගහතුඩුව අතුරු මාර්ග ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 200,000.00ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය ලබාදීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව, ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා, ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. වී. නිලුක එරන්ද ගුණසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා, ගරු මන්ත්‍රීනී ඩී. ඩී. ගංගා කුමාරි විජේවර්ධන මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. එල්. සෝමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ජේ. නිරෝෂන් මුණසිංහ මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාවට විපක්ෂව, ගරු මන්ත්‍රීනී එච්. ඩී. එච්. නදීකා විජේරත්න මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාව සඳහා, ගරු මන්ත්‍රී හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. ලෙනිකා දූෂාන්ති මැතිතුමිය ඡන්දය දීමෙන් වැළකී සිටි අතර,

එම යෝජනාව අවස්ථාවේ, ගරු මන්ත්‍රීනී පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය, ගරු මන්ත්‍රී එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා මේ අවස්ථාව වනවිට සභාවට නොපැමිණෙන ලදී.

සූරියගම කොස්ගහතුඩුව අතුරු මාර්ග ඉතිරි කොටස තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් තාක්ෂණ සේවා නිලධාරි විසින් සකස් කරන ලද රු. 200,000.00ක් වූ ඇස්තමේන්තුව අනුමැතිය ලබාදීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව ඡන්ද 16ක් ද, විපක්ෂව ඡන්ද 4 ක් ද, ඡන්දය දීමෙන් වැළකී

සිටි මන්ත්‍රීවරු 2 ක් ද, නොපැමිණි මන්ත්‍රීවරු 2ක් ද, සිටි අතර, ඒ අනුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**<u>5.2. ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී ඇති යෝජනා :-</u>**

5.2.1. කොස්ගහතුඩුව අතුරු මාර්ගවල ඉතිරිකොටස සංවර්ධනය කිරීම එකමුතු ප්‍රජා මණ්ඩලය මඟින් සිදුකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
මෙම යෝජනාවටත් මම විරුද්ධයි. 5.1.9. හා 5.1.10 යෝජනා සඳහා දරණ මතයම මෙම යෝජනාවටත් දරණවා.

එම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.ඩී. චානිකා නදීශානි මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

ඒ අනුව කොස්ගහතුඩුව අතුරු මාර්ගවල ඉතිරිකොටස සංවර්ධනය කිරීම එකමුතු ප්‍රජා මණ්ඩලය මඟින් සිදුකිරීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව, ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා, ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා, ගරු මන්ත්‍රීනී ඩී. ඩී. ගංගා කුමාරි විජේවර්ධන මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. එල්. සෝමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ජේ. නිරෝෂන් මුණසිංහ මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාවට විපක්ෂව, ගරු මන්ත්‍රීනී එච්. ඩී. එච්. නදීකා විජේරත්න මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාව අවස්ථාවේ, ගරු මන්ත්‍රී හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රීනී පී. ලෙනිකා දූෂාන්ති මැතිතුමිය මේ අවස්ථාව වනවිට සභා පරිශ්‍රය තුළ නොසිටි අතර, ගරු මන්ත්‍රීනී පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය, ගරු මන්ත්‍රී එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා මේ අවස්ථාව වනවිට සභාවට නොපැමිණෙන ලදී.

කොස්ගහතුඩුව අතුරු මාර්ගවල ඉතිරිකොටස සංවර්ධනය කිරීම එකමුතු ප්‍රජා මණ්ඩලය මඟින් සිදුකිරීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව ඡන්ද 16ක් ද, විපක්ෂව ඡන්ද 4 ක් ද, සභා පරිශ්‍රයේ නොසිටි

හා නොපැමිණි මන්ත්‍රීවරු 4ක් ද, සිටි අතර, ඒ අනුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

**<u>5.3. ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>**

5.3.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගබඩා විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද 2023.01.11 දිනැති ද්‍රව්‍ය අධියාචනා පත්‍රය අනුව පහත සඳහන් ලිපි ද්‍රව්‍ය ඇණවුම් කර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| | ද්‍රව්‍ය | | ගබඩාවේ ඇති ප්‍රමාණය | | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| I. | A3 | - | 267 | - | 500 |
| II. | හාෆ් ෂීට් | - | 510 | - | 1000 |
| III. | CR 40 | - | 37 | - | 50 |
| IV. | CR 80 | - | 35 | - | 50 |
| V. | CR 120 | - | 38 | - | 50 |
| VI. | CR 160 | - | 0 | - | 50 |
| VII. | CR 200 | - | 0 | - | 50 |
| VIII. | 6*3.5 ලියුම් කවර(සභාවේ නම මුද්‍රිත) | - | 950 | - | 3000 |
| IX. | 9*4 ලියුම් කවර(සභාවේ නම මුද්‍රිත) | - | 310 | - | 5000 |
| X. | 9.5*4.5 ලියුම් කවර(සභාවේ නම මුද්‍රිත) | - | 2600 | - | 1500 |
| XI. | 10*15 ලියුම් කවර(සභාවේ නම මුද්‍රිත) | - | 0 | - | 2000 |
| XII. | ද්‍රව්‍ය ඇණවුම් පොත් | - | 4 | - | 5 |
| XIII. | ලිපි ශීර්ෂ පොත්(මන්ත්‍රීවරුන්ගේ) | - | 8 | - | 22 |
| XIV. | ගෙවීම් මුදල් පොත් | - | 1 | - | 5 |
| XV. | රෝගීන් පැමිණීමේ නාම ලේඛන | - | 4 | - | 6 |
| XVI. | ලැබෙන ලිපි ලේඛන(සාමාන්‍ය) | - | 1 | - | 3 |
| XVII. | ලැබෙන ලිපි ලේඛන(ලි.ප.තැ) | - | 2 | - | 4 |
| XVIII. | පොදු 125(නිවාඩු ඉල්ලුම්පත්) | - | 1000 | - | 3000 |
| XIX. | ප්‍රා.ස 35 වවුචර් පොත් | - | 30 | - | 50 |
| XX. | උපපත්‍රිකා ලේඛන | - | 0 | - | 2 |
| XXI. | නඩු ලේඛන | - | 1 | - | 2 |
| XXII. | කේ පෝරම පොත් | - | 0 | - | 6 |
| XXIII. | රෝගීන් පැමිණීමේ නාම ලේඛන | - | 3 | - | 4 |
| XXIV. | පොත් තුණ්ඩු | - | 300 | - | 4000 |
| XXV. | පොත් බැහැරදීමේ දින පත්‍රිකා | - | 400 | - | 3000 |
| XXVI. | ස්ටෙප්ලර් මැෂින් | - | 4 | - | 6 |
| XXVII. | පංචර් | - | 2 | - | 6 |
| XXVIII. | ස්ටෙප්ලර් කටු (කුඩා පෙට්ටි) | - | 17 | - | 20 |
| XXIX. | ගම් බෝතල් (50mg) | - | 2 | - | 25 |
| XXX. | අගල් 2 සෙලෝටේප් | - | 0 | - | 100 |
| XXXI. | පැන්සල් | - | 1 | - | 50 |
| XXXII. | මකන | - | 3 | - | 20 |

| | | | | | |
|---|---|---|---|---|---|
| XXXIII. | ගණක යන්ත්‍ර | - | 5 | - | 5 |
| XXXIV. | Cannon NPG 59 Toner | - | 2 | - | 2 |
| XXXV. | Samsung 111 SEE Toner | - | 1 | - | 3 |
| XXXVI. | Cannon-Lbp-6300-319 | - | 2 | - | 2 |
| XXXVII. | 30A HP Toner | - | 0 | - | 6 |
| XXXVIII. | Bulldo Clips | - | 0 | - | 20 |
| XXXIX. | 052H Cannon Toner | - | 1 | - | 4 |
| XL. | කර්මාන්ත/ව්‍යාපාර පිළිබඳ බදු අයකිරීම | - | 5 | - | 10 |
| XLI. | වෙළඳ බලපත්‍ර ලබා ගැනීමේ නිවේදන | - | 10 | - | 10 |

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 09.45 ට ගරු මන්ත්‍රීනී පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.

5.3.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය විදුලි උපාංග ලබා ගැනීම සඳහා ගබඩා විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද 2023.01.11 දිනැති ද්‍රව්‍ය අධියාචනා පත්‍රය අනුව පහත සඳහන් විදුලි උපාංග ඇණවුම් කර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| | ද්‍රව්‍ය | | ගබඩාවේ ඇති ප්‍රමාණය | | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| I. | 5A තම්ලර් ස්විච් | - | 313 | - | 500 |
| II. | ත්‍රෙඩ් හෝල්ඩර් | - | 322 | - | 500 |
| III. | 7/0.67 Pvc Copper වයර් රෝල් | - | 0 | - | 2 |

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.3. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාවට අවශ්‍ය සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ගබඩා විෂයභාර නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද 2023.01.11 දිනැති ද්‍රව්‍ය අධියාචනා පත්‍රය අනුව පහත සඳහන් සනීපාරක්ෂක ද්‍රව්‍ය ඇණවුම් කර ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| | ද්‍රව්‍ය | | ගබඩාවේ ඇති ප්‍රමාණය | | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| I. | කොමඩ් බ්‍රෂ් | - | 4 | - | 10 |
| II. | ඉදල් | - | 4 | - | 6 |
| III. | ටීපෝල් | - | 4 | - | 10 |
| IV. | පයිනෝල් | - | 9 | - | 10 |
| V. | ප්ලාස්ටික් කොසු | - | 4 | - | 10 |
| VI. | හාපික් | - | 6 | - | 25 |
| VII. | හැන්ඩ් වොෂ් | - | 7L | - | 30L |
| VIII. | කොහු සහිත කොසු | - | 0 | - | 10 |

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.4. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් මහ ඌරගහ කැකිරිගත්හේන (පහළකඩේ වටරවුම්) මාර්ගයේ මැනුම් කටයුතු කිරීම වෙනුවෙන් මැනුම් ගාස්තු ලෙස රු.30,000.00 ක මුදලක් බෙන්තොට, ඔබඩවත්ත, ධර්මගිරි ලිපිනයේ පදිංචි එම්. ඩබ්. කේ. ධර්මවර්ධන මහතා වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.5. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් ඉඳුරුව උප කාර්යාල භූමියේ පවතින ළමා උද්‍යානය රාත්‍රී කාලයේදී අඳුරුව පවතින බැවින් එහි විදුලි ආලෝකකරණය හා අලංකරණය සඳහා අවශ්‍ය උද්‍යාන විදුලි ආලෝක පහන් කණු 6ක් හා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.6. "අමතරව කරන ලද වැඩ සඳහා මුදල් ලබාගැනීම සම්බන්ධව " යන මැයෙන් යුතුව මිරිස්වත්ත සරුකෙත ගොවි සංවිධානයේ ගරු ලේකම් විසින් ඉදිරිපත් කර ඇති 2023.01.11 දිනැති ලිපියට අනුව මිරිස්වත්ත මහකුරුන්ද 04 වන පටුමග හා මිරිස්වත්ත මහකුරුන්ද 05 වන පටුමග මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ගිවිසුම් ගත ඇස්තමේන්තු මුදලට වඩා වැඩි මුදලක් දැරීමට සිදු වී ඇති බැවින්, එම මුදල පිළිවෙලින් රු. 29570.06ක මුදලක් හා රු. 16,204.50ක මුදලක් ඔවුන්ට ලබා දීම පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී. එල්. සෝමසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.7. බෙන්තොට ප්‍රාදේශීය සභාව 2023 වර්ෂයේ ඉදිකිරීම් කර්මාන්ත ද්‍රව්‍ය සඳහා ලියාපදිංචි වී ඇත්තේ බල ප්‍රදේශයෙන් පිටත ආයතනය වන බැවින්, ප්‍රාදේශීය සභාවට ආසන්න ස්ථානවලින්ද මිල ගණන් කැඳවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.8. මිරිස්වත්ත මහකුරුන්ද IV වන පටුමග ප්‍රතිසංස්කරණය අදාල අවසන් ගෙවීම් බිල්පත් ගාස්තු ලෙස රු.828,685.85 ක මුදලක් මිරිස්වත්ත සරුකෙත ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.9. මිරිස්වත්ත මහකුරුන්ද V වන පටුමග ප්‍රතිසංස්කරණය අදාල අවසන් ගෙවීම් බිල්පත් ගාස්තු ලෙස රු. 719,975.00 ක මුදලක් සරුකෙත ගොවි සංවිධානය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.10. හබුරුගල පාසල අසල සිට සූරියගම දක්වා දිවෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාල අවසන් ගෙවීම් බිල්පත් ගාස්තු ලෙස රු.1,722,619.38 ක මුදලක් හබුරුගල එකමුතු ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.11. මහඋෆරගහ රන්තොටුවිල මාර්ගයෙන් ආරම්භවන හබුරුගල වසන්ත වික්‍රමරත්න මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය ප්‍රතිසංස්කරණය අදාල අවසන් ගෙවීම් බිල්පත් ගාස්තු ලෙස රු.718,845.65 ක මුදලක් හබුරුගල එකමුතු ප්‍රජා මණ්ඩලය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.12. මහඉඳුරුව, දෙහිගහවෙල දොඹගහවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය අදාල අවසන් ගෙවීම් බිල්පත් ගාස්තු ලෙස රු.1,429,494.79 ක මුදලක් මහඉඳුරුව ශක්ති වැඩිහිටි සමිතිය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.13. "ආහාර සාම්පල ලබාගැනීම සඳහා වන අත්තිකාරම් මුදල සංශෝධනය කරලීම" යන මැයෙන් යුතුව ඉඳුරුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ අංක GAL/MOH/Ind/ හා 2023.01.10 දිනැති ලිපිය අනුව ආහාර සාම්පල ලබාගැනීම සඳහා වන අත්තිකාරම් මුදල රු. 2000/- ක මුදලක් මීට පෙර ලබා දුන් අතර, වර්තමාන වෙළඳපල මිල ගණන් සමඟ අදාල මුදල ආහාර සාම්පල ලබාගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, සභාව මඟින් ලබා දෙන අත්තිකාරම් මුදල රු. 5000/- දක්වා ඉහළ දැමීම පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.14. බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින පලුදු සහිත මාර්ග සකස්කිරීමට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පවතින ප්‍රිමික්ස් (කියුබ් 05ක් පමණ) මිලදී ගෙන සිදුකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා</u>**
ගරු සභාපතිතුමා, මෙම යෝජනාවත් මීට පෙර කරන ලද යෝජනාවන්ට සමානයි. ඡන්ද ලබා ගැනීමේ අරමුණින් සිදු කිරීමක් ලෙස හැඟෙන බැවින්, මම එම යෝජනාවටත් විරුද්ධයි.

එම යෝජනාව සඳහා ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් බෙදීමක් ඉල්ලා සිටි බැවින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමණාකරණ සහකාර කේ.ඩී. චානිකා නදීශානි මහත්මිය එක් එක් සභිකයාගේ නම් ප්‍රකාශ කරමින් ඡන්දය විමසා සටහන් කර ගන්නා ලදී.

ඒ අනුව බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින පලුදු සහිත මාර්ග සකස්කිරීමට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පවතින ප්‍රීමික්ස් (කියුබ් 05ක් පමණ) මිලදී ගෙන සිදුකිරීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව, ගරු සභාපති පී. ඩී. සරත් ආනන්ද මැතිතුමා, ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා, ගරු මන්ත්‍රී හෙට්ටිආරච්චිගේ ප්‍රේමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වළල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා, ගරු මන්ත්‍රිනී ඩී. ඩී. ගංගා කුමාරි විජේවර්ධන මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. ඒ. අයේෂ් මධුසංඛ මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. එච්. ඒ. චාන්දනී හේමාලි මැණිකේ මැතිතුමිය, ගරු මන්ත්‍රී පී. එල්. සෝමසිරි මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ඩබ්. අයෝධ්‍යා විජේමාලි මැතිතුමිය, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂාන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ජේ. නිරෝෂන් මුණසිංහ මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාවට විපක්ෂව, ගරු මන්ත්‍රිනී එච්. ඩී. එච්. නදීකා විජේරත්න මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩබ්. ඒ. නිපුන රුවන් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා ඡන්ද ප්‍රකාශ කරන ලද අතර,

එම යෝජනාව අවස්ථාවේ, ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා මේ අවස්ථාව වනවිට සභා පරිශ්‍රය තුළ නොසිටි අතර, ගරු මන්ත්‍රී එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා මේ අවස්ථාව වනවිට සභාවට නොපැමිණෙන ලදී.

බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින පලුදු සහිත මාර්ග සකස්කිරීමට පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පවතින ප්‍රීමික්ස් (කියුබ් 05ක් පමණ) මිලදී ගෙන සිදුකිරීමේ සංවර්ධන යෝජනාවට පක්ෂව ඡන්ද 18ක් ද, විපක්ෂව ඡන්ද 04 ක් ද, සභා පරිශ්‍රයේ නොසිටි හා නොපැමිණි මන්ත්‍රීවරු 02ක් ද, සිටි අතර, ඒ අනුව එම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත විය.

5.3.15. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් බෙන්තොට මහජන පුස්තකාලයට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

I. ප්‍රින්ට් සහ ෆොටෝකොපි කල හැකි මැෂිමක්
II. ලිපිකරු මේස 2ක්
III. පුටු 2ක්

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.16. "ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා සහයෝගය ලබා ගැනීම" යන මැයෙන් යුතුව ඉඳුරුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ අංක GAL/MOH/Ind/ හා 2023.01.12 දිනැති ලිපිය අනුව නිලධාරීන් 35 දෙනෙකු සහභාගීව 2023.01.17 දින දෝපේ වසමේ ගස්දෙකවත්ත අවට ප්‍රදේශ තුල නිවාස පරීක්ෂා කිරීමේ වැඩසටහනේ සංග්‍රහ කටයුතු සඳහා රු. 19,950/- ක මුදලක් සභා අරමුදලින් ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.3.17. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් හබුරුගල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගී සත්කාරක සේවාවන් වෙනුවෙන් අවශ්‍ය රු.577,285.00 ක ඖෂධ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙතින් ඇනවුම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.3.18. "කැඩී අබලන් වී ඇති බෝක්කුවක් පිළිසකර කිරීම සම්බන්ධයෙනි" යන මැයෙන් යුතුව නො.483, අතුරුවැල්ල, ඉඳුරුව ලිපිනයේ පදිංචි බී.ඩී.චන්දන ප්‍රභාත් යන අය විසින් 2023.01.03 දිනැති ලිපියට අනුව ඉඳුරුව ගල්බඩ ග්‍රාම නිලධාරී වසමේ ඉඳුරුව දුම්රිය ස්ථානය අසල 264/C, ගල්බඩ, ඉඳුරුව ලිපිනයේ පදිංචිව සිටි නැසීගිය මිල්ටන් පියදාස මහතාගේ නිවස අසල 4/269 විදුලි කණුව අසල පාර හරහා වතුර බැසයන බෝක්කුව කැඩී අබලන් වී ඇති නිසා එම නිවසේ වර්තමාන අයිතිය ඇති විදේශගතව සිටින බී.ඩී.වරුනි සමන්තිකා විසින් ඇයගේ පෞද්ගලික වියදමින් අබලන් බෝක්කුව සංවර්ධනය කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින්, ඒ සඳහා ගරු සභාවේ අවසරය ලබාදීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**<u>ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා</u>**

පෞද්ගලික වියදමින් කලද සභාවේ තාක්ෂණ සේවා නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ සිදුකල යුතුයි.

එම යෝජනාවට අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ සේවා නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට ඒකමතිකව සහා සම්මත විය.

**<u>5.4. ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී නොමැති යෝජනා :-</u>**

5.4.1. ආරච්චිමුල්ල කෝම්මල පාරේ වෙල්ලගොඩ ඇලට සම්බන්ධවන දකුණුපස මීටර් 40ක් පමණ වන පැති කාණුව කොන්ක්‍රීට් කාණුවක් ලෙස පිළිසකර කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

5.4.2 කටුකුරුන්ද යාය පාර සංවර්ධනය කිරීම කෝම්මල වැඩිහිටි සමිතිය මඟින් සිදුකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමාගේ ස්ථීරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.4.3 කෝම්මල ආතර් කොලින් මාවත දෙවන පටුමඟ සංවර්ධනය කිරීම කෝම්මල සුභ සාධක සමිතිය මඟින් සිදුකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමාගේ ස්ථීරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

5.4.4. හුංගන්තොට තොටවත්ත පාර සංවර්ධනය කිරීම බෝධිමළුව වැඩිහිටි සමිතිය මඟින් සිදුකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමාගේ ස්ථීරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**5.5. ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති යථා පරිදි කල් දී නොමැති යෝජනා :-**

5.5.1. ගරු මහජන නියෝජිතයින් සම්බන්ධ වී කටයුතු කරනු ලබන කමිටුවලට අදාළව ගන්නා තීරණ තුළ සභාව මඟින් සංවිධානය වන උත්සව අවස්ථාවන්හිදී සංවිධාන කටයුතු සිදුකිරීමටත්, තවදුරටත් මහ සභාව මඟින් සෑම උත්සව අවස්ථාවන්වලට අදාළව සංවිධාන කටයුතු ඇතුළු වැඩිමනක් කාරණාවලට අවසන් අනුමැතිය ගෙන කටයුතු කරන ලෙසට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, එම අවස්ථාවේ දී ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා විසින් වැඩිදුරටත් අදහස් දක්වන ලදී.

**ගරු මන්ත්‍රී එච්. ඩී. දිලාන් මධුරංග මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2023 ලැබුවා වූ නව වසර සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයේ සියළු දෙනාටමත් සතුට සමාදානය පිරුණු යුක්තිය රජයන රටක අභිමානවත් පුරවැසියන් වීමට අවස්ථාව ලැබෙන්න යැයි ප්‍රාර්ථනා කරනවා. මෑත කාලයේදී සභාව මඟින් සංවිධානය කරන ලද උත්සව දෙකක් පවත්වනු ලැබුවා. මහජන නියෝජිතයකු ලෙස මම සහභාගී වුනා. පෙරපාසල් දරුවන් වෙනුවෙන් ලස්සන උත්සවයක් පැවැත්වුනා. මෙම බල ප්‍රදේශයේ ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන පෙරපාසල් තිබෙනවා. අලුත්ගම ප්‍රදේශයේ අන්තර් ජාතික මට්ටමේ පෙර පාසල් පැවැත්වෙනවා. ප්‍රාදේශීය සභා පෙර පාසල්වලට බොහෝවිට සහභාගී වන්නේ සාමාන්‍ය පන්තියේ ආදරණීය දෙමව්පියන්ගේ දරුවන්ය. පෙරපාසල් උත්සවය සාර්ථකව සංවිධානය කර තිබුණා. ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුතිය පුද කරනවා. මෙම උත්සවය සඳහා හොඳ නිවේදකයෙක් තෝරා ගෙන තිබුණා. එම නිවේදකයා පටන්ගත් මොහොතේ සිට ලස්සන වචන භාවිතා කර දරුවන්ගේ වැඩසටහන ප්‍රේක්ෂකාගාරය සිත් ඇදගන්නා ආකාරයට පවත්වාගෙන ගියා. මගේ හිතත් ඇදී ගියා. නිවේදන කටයුතු යනු කලාවක්. නිවේදනය සඳහා හැකියාව වගේම අවස්ථාව හඳුනාගෙන දැනුම භාවිතා කර සිදු කිරීම කල යුතුයි. දෙමව්පියන් කිහිප දෙනෙකු මා සමඟ කතා කර හොඳ වැඩසටහනක් බව ප්‍රකාශ කලා. මෙම උත්සවයට පෙර පුස්තකාලය සම්බන්ධ උත්සවයක්

ප්‍රදේශයේ ආසන්න ස්ථාන වෙත මිල ගණන් ඉදිරිපත් කළ අතර සියලු ආයතන වෙතින් මිල ගණන් ලැබී ඇත.

ඒ අනුව සම්පූර්ණ අයිතම ප්‍රමාණය සඳහා අවම මිලක් ඉදිරිපත් කර තිබීම,ප්‍රවාහන පහසුකම් සැපයීම යන කරුණු මත හබුරුගල, තැපැල් කාර්යාලය අසල, සුහන්සා හාඩ්වෙයාර් වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සේවක විවේක කාමරයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**06.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩා සඳහා උදළු තල ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

**මිල ගණන් කැඳ වූ කාලය - 2022/12/02 – 2022/12/14**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | | **සුහන්සා හාඩ්වෙයාර්, තැපැල් කාර්යාලය අසල, හබුරුගල** | **දූනාරා ට්‍රේඩ් සෙන්ටර්, ඇල්පිටිය පාර, ආරච්චිමුල්ල** | **සේනානායක හාඩ්වෙයාර්, ඇලකාක, හබුරුගල** |
|---|---|---|---|---|
| **උදළු තල ( 9 x 9 ) ගොඩ වැඩ සඳහා 15 ක්** | **වර්ගය** | - | කෙවින් | කිඹුලා |
| | **ඒකකයක මිල(රු)** | 2700/- | 2800/- | 3800/- |
| | **වගකීම් කාලය** | - | අවු:05 | - |
| | **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත | සඳහන් කර නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව ඉදුරුව තාක්ෂණ සේවා නිලධාරි වෙත යොමු කල අතර එහි දී ගොඩ වැඩ සඳහා අවු:05 ක වගකීම් කාලයක් ලබා දෙන කෙවින් වර්ගයේ උදළු තලය සුදුසු බව යෝජනා කරන ලදී.

ඒ අනුව සලකා බැලූ ප්‍රසම්පාදන කමිටුව ආරච්චිමුල්ල, ඇල්පිටිය පාර, දූනාරා ට්‍රේඩ් සෙන්ටර් වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා උදළු තල ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

07.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ජල ටැංකියට නව ජල ටැංකියක් එකතු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>.

**මිල ගණන් කැඳ වූ කාලය - 2022/12/02 – 2022/12/14**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | සුහන්සා හාඩ්වෙයාර්, තැපැල් කාර්යාලය අසල, හබුරුගල<br><br>ඒකකයක මිල(රු.) | සේනානායක හාඩ්වෙයාර්, ඇලකාක, හබුරුගල<br><br>ඒකකයක මිල(රු.) | දූනාරා ට්‍රේඩ් සෙන්ටර්, ඇල්පිටිය පාර, ආරච්චිමුල්ල<br><br>ඒකකයක මිල(රු.) |
|---|---|---|---|
| **11/2" PVC බට (hevi) 02** | S – LON<br>2800/- | S – LON<br>2900/- | S – LON<br>2400/- |
| **1 ½ බෙන්ඩ් සොකට් 04** | S – LON<br>650/- | S – LON<br>700/- | S – LON<br>780/- |
| **1 ½ (T) සොකට්** | S – LON<br>550/- | S – LON<br>550/- | S – LON<br>670/- |
| **1 ½ ජොයින්ට් සොකට් 02** | S – LON<br>250/- | S – LON<br>300/- | S – LON<br>320 |
| **1 ½ රබර් වොෂර් 10** | S – LON<br>50/- | 60/- | S – LON<br>40/- |
| **S – LON ගම් 50 g** | - | S – LON<br>440/- | S – LON<br>440/- |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත | නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව සම්පූර්ණ අයිතම එකතුව සඳහා අවම මිල ගණනක් ඉදිරිපත් කර තිබීම යන කරුණු මත ආරච්චිමුල්ල, ඇල්පිටිය පාර, දූනාරා ට්‍රේඩ් සෙන්ටර් වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ජල ටැංකියට නව ජල ටැංකියක් එකතු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

08.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් ප්‍රධානෝත්සවය සඳහා අවශ්‍ය ත්‍යාග භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | ලංකා ස්ටෝර්ස්, 14,16, මතුගම පාර, අළුත්ගම<br><br>ඒකකයක මිල(රු.) | චාමර බුක් ශොප්, නො.03, බස් නැවතුම්පොළ සාප්පු සංකීර්ණය, ගාලු පාර, අම්බලන්ගොඩ<br><br>ඒකකයක මිල(රු.) | ලුමිනෙක්ස් බුක්ශොප් ප්‍රයිවට් ලිමිටඩ්, නො.98,ගාලු පාර, අම්බලන්ගොඩ<br><br>ඒකකයක මිල(රු.) | චන්ද්‍රා ස්ටෝර්ස්, නො.107, කෙලින් වීදිය, ගොඩකවෙල<br><br>ඒකකයක මිල(රු.) |
|---|---|---|---|---|
| පිටු 80 රූල් නැති | 108 | 82 | 234 | 120.00 |

| | | | | |
|---|---|---|---|---|
| **පොත් 316** | | | | (RATHNA) |
| **අහල් 1 තනිරුල් පොත් 166** | 108 | 55 | 108 | 97.50(ATLAS) |
| **අහල් 1 කොටුරුල් පොත් 166** | 108 | 55 | 108 | 97.50(ATLAS) |
| **අහල් ½ කොටුරුල් පොත් 150** | 108 | 82 | 108 | 97.50(ATLAS) |
| **පිටු 80 චිත්‍ර පොත් 14** | 243 | 190 | 243 | 232.00(ATLAS) |
| **පස්රුල් පොත් 150** | 108 | 200 (CR) | 117 | 97.50(ATLAS) |
| **පිටු 120 බොට්නි CR පොත් 158** | 288 | 280 | 288 | 698 |
| **කූරු 24 පාට පෙට්ටි 158** | 306 | 145 | 369 | 357 |
| **අහල් 1 ඩබල් රුල් පොත් 83** | 108 | 55 | 108 | 97.50(ATLAS) |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත | ඔව් | ඔව් |

මිල ගණන් සලකා බැලූ කමිටුව සම්පූර්ණ අයිතම එකතුව සඳහා අවම මිල ගණනක් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, ගාලු පාර, බස් නැවතුම් පොළ සාප්පු සංකීර්ණය, නො.03 දරන ස්ථානයේ චාමර බුක්ෂොප් වෙතින් පෙර පාසල් ත්‍යාග ප්‍රධාන උත්සවයේ ත්‍යාග භාණ්ඩ ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**09.<u>ජාතික කියවීමේ මාසයේ ප්‍රධානෝත්සවය සඳහා අවශ්‍ය ත්‍යාග භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>.**
**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **ලංකා ස්ටෝර්ස්, 14,16, මතුගම පාර, අළුත්ගම<br><br>ඒකකයක මිල(රු.)** | **චාමර බුක් ශොප්, නො.03, බස් නැවතුම්පොළ සාප්පු සංකීර්ණය, ගාලු පාර, අම්බලන්ගොඩ<br><br>ඒකකයක මිල(රු.)** | **ලුමිනෙක්ස් බුක්ශොප් ප්‍රයිවට් ලිමිටඩ්, නො.98,ගාලු පාර, අම්බලන්ගොඩ<br><br>ඒකකයක මිල(රු.)** | **චන්ද්‍රා ස්ටෝර්ස්, නො.107, කෙලින් වීදිය, ගොඩකවෙල<br><br>ඒකකයක මිල(රු.)** |
|---|---|---|---|---|
| **පිටු 120 තනිරුල් පොත් 579** | 153/- | 114/- | 333/- | 130/-( ATLAS) |
| **පිටු 120 CR තනිරුල් පොත්** | 288/- | 240/- | 333/- | 317/- (ATLAS) |

| | | | | |
|---|---|---|---|---|
| 132 | | | | |
| **පිටු 120 CR කොටු රූල් පොත් 27** | 288/- | 240/- | 333/- | 317/- (ATLAS) |
| **පිටු 160 CR තනිරූල් පොත් 48** | 445.50/- | 315/- | 445.50/- | 410/-( ATLAS) |
| **පිටු 160 තනිරූල් පොත් 36** | 216/- | 155/- | 445.50/- | 180/-( ATLAS) |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත | ඔව් | ඔව් |

මිල ගණන් සලකා බැලූ කමිටුව සම්පූර්ණ අයිතම එකතුව සඳහා අවම මිල ගණනක් ඉදිරිපත් කර ඇති අම්බලන්ගොඩ, ගාලු පාර, බස් නැවතුම් පොළ සාප්පු සංකීර්ණය, නො.03 දරන ස්ථානයේ චාමර බුක්ශොප් වෙතින් ජාතික කියවීමේ මාසයේ ප්‍රධානෝත්සවය සඳහා අවශ්‍ය ත්‍යාග භාණ්ඩ ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

10.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා ෆයිල් හෝල්ඩර් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>.

**මිල ගණන් කැඳ වූ කාලය - 2022/12/02 – 2022/12/14**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **ලුම්නෙක්ස් බුක්ශොප් ප්‍රයිවට් ලිමිටඩ්, නො.98,ගාලු පාර, අම්බලන්ගොඩ<br><br>ඒකකයක මිල(රු.)** | **චන්ද්‍රා ස්ටෝර්ස්, නො.107, කෙලින් වීදිය, ගොඩකවෙල<br><br>ඒකකයක මිල(රු.)** | **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, නො.15, දුම්රියපොළ පාර, මාතර** |
|---|---|---|---|
| **ෆයිල් හෝල්ඩර් 150ක්** | PANTHER(5882) 684/- | අඟල් 3" – INPEK 690/-<br>අඟල් 4" – 750/-<br>අඟල් 6" – 950/- | අඟල් 4" – (587.98+VAT 15%)/-<br>අඟල් 6" – (675.30+VAT15%)/- |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | සඳහන් කර නැත | නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව අඟල් ගණන සඳහන් කර නොමැති ලුම්නෙක්ස් ආයතනය වෙත දුරකථනයෙන් විමසීම් කරන ලදී.ඒ අනුව අඟල් 4" රු.680 ක් බවද අඟල් 6" රු.830 ක් බවද පවසන ලදී.

ඒ අනුව ගබඩාව සඳහා අවශ්‍ය අඟල් ප්‍රමාණය ගබඩා විෂය නිළධාරිගෙන් විමසන ලදී.එය අඟල් 6" බව පැවසීය.

මිල ගණන් සලකා බැලූ කමිටුව, රජයේ ආයතනයක් වන මාතර, දුම්රියපොළ පාර , නො.15 දරන ස්ථානයේ සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ)නීතිගත සංස්ථාව මඟින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා ෆයිල් හෝල්ඩර් ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

11.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා බන්ඩල් ක්ලිප් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | **Chaminda Electricals, No:33, Ambedolathanna, Makawita, Matara** | **Asian Electricals, 95/A, First street, Colombo 11**<br><br>ඒකකයක මිල(රු.) | **Marlbo Trading Company, 24, Abdul Gaffoor Mawatha, Colombo 3**<br><br>ඒකකයක මිල(රු.) |
|---|---|---|---|
| **බන්ඩල් ක්ලිප් 500ක්** | NO 01 – 550/-<br>NO 02 – 390/- | CHINA – 344/- | CHINA – (345+VAT15%)/- |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | ඔව් | සඳහන් කර නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව ඉඳුරුව තාක්ෂණ සේවා නිළධාරි වෙත යොමු කළ අතර එහිදී සාම්පල් පරීක්ෂා කල යුතු බව පැවසීය.

ඒ අනුව සලකා බැලූ කමිටුව මිල ගණන් ඉදිරිපත් කර ඇති සියලු ආයතන වෙතින් සාම්පල් ලබා ගෙන තාක්ෂණ සේවා නිළධාරී නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

12.<u>පෙරපාසල් වාර්ෂික විවිධ ප්‍රසංගය හා ත්‍යාග ප්‍රධාන උත්සවයට අවශ්‍ය ශබ්ද විකාශන පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>.

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | **SHAMEN BUFFLE & ELECTRONICS, Yalagama, Induruwa**<br>ඒකකයක මිල(රු.) | **Raj Electrical, Banwelduwa, kosgoda**<br><br>ඒකකයක මිල(රු.) |
|---|---|---|
| **සහභාගිත්ව පිරිස - 500ක් පමණ**<br>**දිනය - 2022 දෙසැම්බර් 26-28 අතර දිනයක්**<br>**වේලාව - පෙ.ව. 9.30**<br>**ස්ථානය - බෙන්තොට ගාමිණී විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වෙන පෙර පාසල් ත්‍යාග ප්‍රධාන උත්සවයේ ශබ්ද විකාශන කටයුතු සඳහා මිල ගණන් ලබා දීම**<br>**01.කතන පුවරු 01**<br>**02.මයික්**<br>**03.වේදිකා විදුලි ආලෝකය ඇතුළුව** | 20,000/- | 15,000/- |

| | | |
|---|---|---|
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Kosgoda, Banwelduwa, Raj Electrical වෙතින් පෙරපාසල් වාර්ෂික විවිධ ප්‍රසංගය හා ත්‍යාග ප්‍රධාන උත්සවයට අවශ්‍ය ශබ්ද විකාශන පහසුකම් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**13.<u>ජාතික කියවීමේ මාසයේ ත්‍යාග ප්‍රධානෝත්සවයට අවශ්‍ය ශබ්ද විකාශන පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>.**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **SHAMEN BUFFLE & ELECTRONICS, Yalagama, Induruwa**<br>**ඒකකයක මිල(රු.)** | **Raj Electricals, Banwelduwa, kosgoda**<br><br>**ඒකකයක මිල(රු.)** |
|---|---|---|
| **සහභාගිත්ව පිරිස - 500ක් පමණ**<br>**දිනය - 2023 ජනවාරි 05**<br>**වේලාව - පෙ.ව. 9.30**<br>**ස්ථානය - බෙන්තොට ගාමිණී විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වෙන ජාතික කියවීමේ මාසයේ ත්‍යාග ප්‍රධාන උත්සවයේ ශබ්ද විකාශන කටයුතු සඳහා මිල ගණන් ලබා දීම**<br>**01.කතන පුවරු 01**<br>**02.මයික්**<br>**03.වේදිකා විදුලි ආලෝකය ඇතුළුව** | 20,000/- | 15,000/- |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Kosgoda, Banwelduwa, Raj Electrical වෙතින් ජාතික කියවීමේ මාසයේ ත්‍යාග ප්‍රධානෝත්සවයට අවශ්‍ය ශබ්ද විකාශන පහසුකම් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>14.ජාතික කියවීමේ මාසයේ ප්‍රධාන උත්සවය සඳහා අවශ්‍ය සහතික පත් මුද්‍රණය කිරීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/02 – 2022/12/14**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **LC Printers & Advertising (pvt) Ltd, No:275,Massala, Beruwala**<br>**ඒකකයක මිල(රු.)** |
|---|---|
| **සහතිකපත්‍ර මුද්‍රණය කිරීම**<br>**160ක්**<br>**4color-A4 SIZE Conga Board** | 90/- |

| | |
|---|---|

ලියාපදිංචි සැපයුම්කාර ආයතන වෙත මිල ගණන් ලිපි ඉදිරිපත් කළ අතර පහත ආයතන වෙතින් මිල ගණන් ලැබී නැත.

- **New Randika Printers, Galle road, Kaluwamodara, Aluthgama.**
- **Woo Bee Advertising & Printing, No.707, Galle Road, Panadura.**

ඒ අනුව සහතික පත්‍ර කඩිනමින් මුද්‍රණය කර ගැනිමට අවශ්‍ය බැවින් සහ Beruwala ,Massala No:275 දරන ස්ථානයේ LC Printers & Advertising (pvt) Ltd අයතනය වෙතින් අවශ්‍ය සහතික පත් මුද්‍රණය කර ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**15.2022/12/12 දිනැතිව ‘ මුද්‍රණ කටයුතු සැපයීම’ යන මැයෙන් අලුත්ගම, දුම්රියපොළ පාර, අංක 50 ඒ දරන ස්ථානයේ ශ්‍රී විජය ප්‍රින්ටර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති ලිපිය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරිම.**

2022/11/29 දිනැති ප්‍රසම්පාදන කමිටු අංක 09 හා 10 තීරණ අනුව 2022/11/30 දින බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා මුද්‍රිත ලේඛන ලබා ගැනීමට සහ වර්ණ ලිපි ශීර්ෂ ලබා ගැනීමට ඇණවුම් නිකුත් කරන ලදී.

නමුත් එම මිල ගණන් යටතේ, වෙළෙඳපොලේ පවතින මිල ඉහල යාම හේතුවෙන් අදාළ මුද්‍රණ කටයුතු සිදු කළ නොහැකි බව පවසා නව මිලක් ඒ සඳහා ඉදිරිපත් කර ඇත.

| **ද්‍රව්‍ය / භාණ්ඩ / උපකරණ / සේවා විස්තරය** | **ඒකකයක නව මිල (රු)** | **ඒකකයක පෙර මිල (රු)** |
|---|---|---|
| වර්ණ ලිපි ශීර්ෂ 3000 ක් | 11.70/- | 9/- |
| වෙළඳ බලපත්‍ර 15ක් | 1937/- | 1490/- |
| වෙළඳ බලපත්‍ර ලබා ගැනීමේ නිවේදන 10 ක් | 2710/- | 2085/- |
| කර්මාන්ත / ව්‍යාපාර බදු නිවේදන 10 ක් | 2710/- | 2085/- |
| පැමිණීමේ ලේඛන 05 ක් | 3185/- | 2450/- |

ඒ අනුව සලකා බැලූ ප්‍රසම්පාදන කමිටුව කාර්යාලයට ආසන්න ස්ථානයක් වීම, ප්‍රවාහන පහසුකම් සැපයීම, මීට පෙර අවස්ථාවල දී අප සභාව මෙම ආයතනයෙන් වර්ණ ලිපි ශීර්ෂ මුද්‍රණය කර ලබා ගෙන තිබීම යන කරුණු පදනම් කර ගෙන ඉහත ආයතනයටම වර්ණ ලිපි ශීර්ෂ මුද්‍රණය කරීම සඳහා ලබා දීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

මුද්‍රිත ලේඛන සැපයීමට අදාළව ඉදිරිපත් කර ඇති නව මිල අනෙකුත් ආයතන හා සැසඳූ කමිටුව සියලුම අයිතම සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ එකම ආයතනය වීම සැලකිල්ලට ගනිමින් ඉහත ආයතනයටම මුද්‍රිත ලේඛන මුද්‍රණය කරීම සඳහා ලබා දීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**16.2022/12/12 දිනැති බිත්තර ලබා දීම සම්බන්ධයෙන්’ යන මැයෙන් , හබුරුගල, ඇල්පිටිය පාර, එම්. ඩී. එස්. ස්ටෝර්ස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම**

2022/12/12 දිනැතිව බෙප්‍රාස/ගි/05/08/2022 අංක දරන ලිපියට ප්‍රතිචාර වශයෙන් ඉහත ලිපිය ඉදිරිපත් කර ඇති අතර බිත්තරයක් ලබා දිය හැකි අවම මිල රු.52/- ක් බව සඳහන් කර ඇත.

මීට ඉහත අවස්ථාවකද බිත්තර සඳහා මිල ගණන් කැඳ වූ අතර ඒ අනුව තෝරා ගත් ආයතන කිසිවක් රටේ පවතින මිල ගණන් විචලනය වීම, බිත්තර හිඟ වීම යන කරුණු හේතුවෙන් බිත්තර ලබා දීමට නොහැකි බව පවසන ලදී.

ඒ අනුව දෙවන වරටද මිල ගණන් කැඳවූ අතර එහි දී තෝරා ගත් ආයතනය ද බිත්තර ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ හේතුවෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබූ සියලු ආයතන වෙත දුරකතනයෙන් විමසීම් කළ අතර එහි දී බිත්තර ලබා දීමට එකඟ වූ එකම ආයතනය එම් . ඩී. එස්. ස්ටොර්ස් පමණි.

ඒ අනුව සලකා බැලූ කමිටුව රටේ පවතින තත්වය, පාසල් ළමුන් වෙනුවෙන් ලබා දෙන ආහාරයක් වීම යන කරුණු සැලකිල්ලට ගනිමින් හබුරුගල, ඇල්පිටිය පාර, එම්. ඩී. එස්. ස්ටෝර්ස් වෙතින් බිත්තරයක් රු.52/- බැගින් බිත්තර ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

01.දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා -ගරු මන්ත්‍රී
02.ඩබ්.ඒ.නිපුන රුවන් මැතිතුමා -ගරු මන්ත්‍රී
03.එච්.ඩී.දිලාන් මදුරංග මැතිතුමා -ගරු මන්ත්‍රී

2022.12.15 දින පැවැති ප්‍රසම්පාදන කමිටු වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**6.2. (II) 2022.12.30 වන දින පෙ.ව .10.00 ට පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හබුරුගල උප කාර්යාලයේදී පවත්වන ලද ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කිරීම.**

**සහභාගීත්වය**

01.පී.ඩී.සරත් ආනන්ද මැතිතුමා -ගරු සභාපති
02.මිගාර වලල්ලාවිට මැතිතුමා -ගරු මන්ත්‍රී
03.දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා -ගරු මන්ත්‍රී
04.එච්.ඩී.දිලාන් මදුරංග මැතිතුමා -ගරු මන්ත්‍රී

**01.බෙන්තොට ප්‍රාදේශීය සභාවේ LL-7293 ජල බවුසරය සඳහා බැටරි ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/19 – 2022/12/29**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | | ENOSHA AUTO ENTERPRISES, No.204, Galle Road, Aluthgama | Siyanray Electricals, Yatadola Road, Darga Town | OMEGA MOTORS, No.41, Super Market (Upstair) Aluthgama |
|---|---|---|---|---|
| ඇම්පියර් 100 | වර්ගය | EXIDE | EXIDE | EXIDE |

| | | | | |
|---|---|---|---|---|
| ධාරිතාවයෙන් යුතු බැටරි 02ක් | ඒකකයක මිල(රු.) | 70,000/- (පරණ බටරියට 3000/-ක් අඩු කරනු ලැබේ.) | 69,800/- (පරණ බටරියට 3200/-ක් අඩු කරනු ලැබේ.) | 78,200/- |
| | වගකීම් කාලය | අවුරුදු 1 ½ | අවුරුදු 1 ½ | අවුරුදු 1 |
| | ප්‍රවාහන පහසුකම් සපයන්නේද | නැත | නැත | නැත |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන වෙත මිල ගණන් ලිපි ඉදිරිපත් කළ අතර එම සියලු ආයතන වෙතින් මිල ගණන් ලිපි ලැබී ඇත.

මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිලක් ඉදිරිපත් කර ඇති Darga Town, Ambagahahandiya, Yatadola Road, Siyanray Electricals වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ LL 7293 ජල බවුසරය සඳහා බැටරි ලබා ගැනීමට සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා HD 46 හයිඩ්‍රොලික් ඔයිල් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/19 – 2022/12/29**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | Jayashani Enterprise, Massalagoda, Dope, Bentota<br><br>ඒකකයක මිල(රු.) | D & D Motors and Service Station, No.124, Yatadola Road, Darga Town<br><br>ඒකකයක මිල(රු.) |
|---|---|---|
| HD 46 හයිඩ්‍රොලික් ඔයිල් ලීටර් 50 | 1300/- | 2100/- |
| ප්‍රවාහන පහසුකම් සපයන්නේද | නැත | ඔව් |

ලියාපදිංචි සැපයුම්කාර ආයතන වෙත හා ප්‍රදේශයේ ආසන්න ස්ථාන වෙත මිල ගණන් ලිපි ඉදිරිපත් කළ අතර පහත ආයතන වෙතින් මිල ගණන් ලැබී නැත.

- **Brown & Company PLC, No.481, T.B. Jayah Mawatha, Colombo 10**

මිල ගණන් සලකා බැලූ කමිටුව අවම මිල ගණනක් ඉදිරිපත් කර තිබූ Bentota, Dope, Massalagoda, Jayashani Enterprise වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා HD 46 හයිඩ්‍රොලික් ඔයිල් ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**03.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පැරණි කාර්යාලය හා හබුරුගල උප කාර්යාලය සඳහා අවශ්‍ය සින්ක් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/19 – 2022/12/29**

| ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය | Suhansa Hardware, Near the Post Office, Haburugala | Dunara Trade Center, Elpitiya Road, Arachchimulla, bentota |
|---|---|---|

| | | |
|---|---|---|
| **ඇලුමිණියම් සින්ක් (අඩි 04) 02 ක්** | 7,700/- | 7,800/- |
| **½ tap 02 ක්** | 1,200/- | 1370/- |
| **Washer with sin vate 02 ක්** | 350/- | 450/- |
| **Frame 02 ක්** | - | - |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | ඔව් | නැත |

මිල ගණන් සලකා බැලූ කමිටුව, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ Haburugala, Near The Post Office, Suhansa Hardware වෙතින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ පැරණි කාර්යාලය හා හබුරුගල උප කාර්යාලය සඳහා අවශ්‍ය සින්ක් ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා පා පැදි තහඩු බලපත්‍ර ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/19 – 2022/12/29**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **ගිහාන්ස්, අංක 110/1, ශ්‍රී රතනජෝති මාවත, කටුබැද්ද, මොරටුව<br><br>ඒකකයක මිල(රු)** | **නදීශා, අංක 44, විශ්ව විද්‍යාල පාර, කටුබැද්ද, මොරටුව<br><br>ඒකකයක මිල(රු)** | **මලිත් ඉන්ඩස්ට්‍රීස්, ගල්ඔලුව, මිනුවන්ගොඩ<br><br>ඒකකයක මිල(රු)** |
|---|---|---|---|
| **පා පැදි තතහඩු 250 ක්** | 75/- | 175/- | 150/- |
| **පා පැදි නොවන තහඩු 21 ක්** | 150/- | - | - |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | සඳහන් කර නැත | සඳහන් කර නැත | |

මිල ගණන් සලකා බැලූ කමිටුව අයිතම 02 සඳහාම මිල ගණන් ඉදිරිපත් කර තිබීම, අවම මිලක් ඉදිරිපත් කර තිබීම යන කරුණු මත මොරටුව, කටුබැද්ද, ශ්‍රී රතනජෝති මාවත, අංක 110/1 දරන ස්ථානයේ ගිහාන්ස් වෙතින් 2023 වර්ෂය සඳහා පා පැදි තහඩු බලපත්‍ර ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**05.<u>බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සේවක විවේක කාමරයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම</u>**

**මිල ගණන් කැඳවූ කාලය - 2022/12/19 – 2022/12/29**

| **ද්‍රව්‍ය / භාණ්ඩ/ උපකරණ/ සේවා විස්තරය** | **NEW PATHMA STORES, No.188, Galle road, Aluthgama<br>ඒකකයක මිල (රු)** | **Regal Gift House, No. 295, Main Street, Darga Town<br><br>ඒකකයක මිල (රු)** | **Keerthi Traders, No. 186/B, Galle Road, Aluthgama<br><br>ඒකකයක මිල (රු)** |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| **ලොකු ඇලුමිණියම් ජොග්ගු 04** | 1200/- | 900/-<br>Large -985 | - |
| **4L විදුලි කේතල් 01** | - | - | 9950/-(50L) |
| **පීරිසි කෝප්ප 50** | 980/- | 950/- | 1000/- |
| **ප්‍රවාහන පහසුකම් සපයන්නේද** | සඳහන් කර නැත | නැත | සඳහන් කර නැත |

ප්‍රදේශයේ ආසන්න ස්ථාන වෙත මිල ගණන් ලිපි ඉදිරිපත් කළ අතර සියලු ආයතන වෙතින් මිල ගණන් ලිපි ලැබී ඇත.

මිල ගණන් සලකා බැලූ කමිටුව, පීරිසි කෝප්ප සඳහා අවම මිල ගණනක් ඉදිරිපත් කර ඇති Darga town, Main Street, No. 295 දරන ස්ථානයේ Regal Gift House වෙතින් දුරකතනයෙන් විමසීම් කරන ලදී. එහි දී ඔවුන් පැවසුවේ එම ආයතනය තුළ ඒ වන විට තොග අවසන් වී ඇති බවයි.
ඒ අනුව දෙවන ස්ථානයට මිල ගණන් ඉදිරිපත් කර ඇති NEW PATHMA STORES වෙතින් ද විමසීම් කරන ලදී. එහි දී white pocelain plain වර්ගයේ කෝප්පයක මිල 980/- බව පවසන ලදී.
ඒ අනුව සලකා බැලූ කමිටුව ලොකු ඇලුමිණියම් ජොග්ගු 04 සහ පීරිසි කෝප්ප 50 Aluthgama, Galle road, No.188, NEW PATHMA STORES වෙතින් ද, විදුලි කේතලය 5L ප්‍රමාණයෙන් Aluthgama, Galle Road, No.186/B දරන ස්ථානයේ KEERTHI TRADERS අයතනයෙන් ද මිල දී ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**06.2023 වර්ෂය වෙනුවෙන් බෙන්තොට ප්‍රාදේශීය සභාව මඟින් සැපයිය යුතු භාණ්ඩ හා සේවා ඇතුළත් සැලැස්ම ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම**

ඒ සම්බන්ධව පරීක්ෂා කළ කමිටුව 2023 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන සැලැස්ම පිළිගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**07.බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කාල සීමාවෙන් පසු ලියාපදිංචි වූ ආයතන 02 ක් ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම.**

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කාල සීමාව 2022/11/30 දිනෙන් අවසන් විය. එම දිනට පසුව ලියාපදිංචි වූ ආයතන 02ක් පහත වේ.

- **Alpha Industries Pvt Ltd, 49/16, Ice Land Building, Galle Road, Colombo-03**
- **Chaminda Electricals, No.33, Ambedolathanna, Makawita, Matara.**

එම ආයතන 02 ඒ පිළිබඳ ලිඛිත ව ඉදිරිපත් කළ ලිපි කමිටුව වෙත ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳ සලකා බැලූ කමිටුව එම ආයතන 02 සභාව සමඟ නිරන්තරයෙන් ගණුදෙණු කරන ආයතන වීම, 2022 වර්ෂයේ සිදුකළ ගණුදෙණු පිළිබඳ සභාව සතුටුදායක වීම, එම ආයතන පිළිබඳ ගොඩනැගී ඇති විශ්වාසය යන කරුණු සැලකිල්ලට ගනිමින් එම ආයතන 02 ,2023 වර්ෂය සඳහා ලියාපදිංචි ආයතන වශයෙන් පිළිගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**08.බෙප්‍රාස/සං/02 විෂයට අයත් පරිගණකය අළුත්වැඩියාවට යොමු කළ අලුත්ගම, ඩග්ලස් ගුණවර්ධන මාවත, නො. 17 දරන ස්ථානයේ MI COMUTERS ආයතනය විසින් ඊට අදාළව ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම.**

| ITEM NAME | QUANTITY | UNIT PRICE | AMOUNT LKR |
|---|---|---|---|
| **15 4th Gen Processer** | **01** | **13,000/-** | **13,000/-** |
| **H 81 Mother Board** | **01** | **10,500/-** | **10,500/-** |
| **450W(6 Pin) Power Supply** | **01** | **4,200/-** | **4,200/-** |
| **1155 CPU Cooler** | **01** | **1,200/-** | **1,200/-** |
| **DVD RW** | **01** | **1,200/-** | **1,200/-** |
| **Golden Field Casing** | **01** | **4,500/-** | **4,500/-** |
| **(03 Month Warranty)** | | | |
| **TOTAL** | | | **34,600/-** |

ඉහත ඇස්තමේන්තුව පරීක්ෂා කර බැලූ කමිටුව, එම මිල ගණන් යටතේ අදාළ පරිගණකයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

**09.2022/12/15 ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 11 පරිදි බන්ඩල් ක්ලිප් සඳහා ඉදිරිපත් කර ඇති සාම්පල් ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම.**

මිල ගණන් ඉදිරිපත් කළ ආයතන 03න් ආයතන 02 කින් පමණක් සාම්පල් ලැබී ඇත. එම ආයතන පහත වේ.

- **Chaminda Electricals, No. 33, Ambedolathanna, Makawita, Matara.**
- **Asian Electricals, 95/A, First Street, Colombo-11**

එම සාම්පල් පරීක්ෂා කර බැලූ කමිටුව විදුලි කාර්මික මහතුන්ගේ හා තාක්ෂණ සේවා නිලධාරී මහතුන්ගේ අදහස් විමසන ලදී. එහි දී දැනට ගබඩාව තුළ පවතින වර්ගයෙන්ම ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

ඒ අනුව සලකා බැලූ කමිටුව ගබඩාව තුළ පවතින බන්ඩල් ක්ලිප් එකක් ගෙන්වා ගෙන අදාළ සාම්පල් සමඟ පරීක්ෂා කර බලා එම වර්ගයට ගැළපෙන සාම්පලයක් ඉදිරිපත් කර ඇති Matara, Makawita, Ambedolathanna, No. 33 දරන ස්ථානයේ Chaminda Electricals වෙතින් රු.390/- බැගින් බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා බන්ඩල් ක්ලිප් ලබා ගැනීම සුදුසු බව ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

01.පී.ඩී.සරත් ආනන්ද මැතිතුමා -ගරු සභාපති
02.මිගාර වලල්ලාවිට මැතිතුමා -ගරු මන්ත්‍රී
03.දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා -ගරු මන්ත්‍රී
04.එච්.ඩී.දිලාන් මදුරංග මැතිතුමා -ගරු මන්ත්‍රී

2022.12.30 දින පැවැති ප්‍රසම්පාදන කමිටු වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී පී. ඒ. සුනිල් සාන්ත මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථීරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>07. ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශය එකතු කල ආදායම් පිළිබඳ ප්‍රකාශ වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම සලකා බැලීම.</u>**

7.1. 2022 දෙසැම්බර් මස ලැබීම් හා ගෙවීම් වාර්තාව ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| **2022 දෙසැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය** | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | 14,446,252.87 |
| එකතු කලා මූලධන ලැබීම් :- | 360.00 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | 14,446,612.87 |
| තැන්පත් | 1,701,813.39 |
| සේවක ණය | 779,390.77 |
| දේපළ ණය පොළී | 13,657.11 |
| සාමාන්‍ය අත්තිකාරම් | 241,629.00 |
| බලපත්‍ර බදු | 20,525.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | 3,575.00 |
| ස්ථාවර තැන්පත් | 7,000,000.00 |
| අහරු චෙක්පත් | 100.00 |
| 208 බැර | 2,060.46 |
| එකතුව | **24,209,363.60** |
| **2022 දෙසැම්බර් මස ඒකාබද්ධ වැය සාරාංශය** | |
| පුනරාවර්තන වියදම් එකතුව | 11,945,171.30 |
| එකතු කලා -ප්‍රාග්ධන වියදම් | 3,222,320.58 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **15,167,491.88** |
| දේපළ ණය පොළී | 12,505.65 |
| තැන්පත් | 312,936.51 |
| සාමාන්‍ය අත්තිකාරම් | 239,331.00 |
| සේවක ණය | 500,000.00 |
| ණය හිමියෝ | 83,826.91 |
| අහරු චෙක්පත් | 2,100.00 |
| එකතුව | **16,318,191.95** |

2022 දෙසැම්බර් මස ලැබීම් හා ගෙවීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්. වී. නිලුක එරන්ද ගුණසේකර මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථීරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>7.2. 2022.12.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2022.12.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරණ පොදු ජංගම ගිණුම, අංක 2759057 දරණ කර්මාන්ත ජංගම ගිණුම, අංක 81618288 දරණ සේවක ණය ජංගම ගිණුම යන

බැංකු ගිණුම්වලට අදාල බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම බැංකු සැසඳුම් වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රී එම්.කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**<u>7.3. 2022.12.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2022.12.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති පී.ඩී. සරත් ආනන්ද මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | 24,417,051.56 |
| 2. අක්කර බදු | 177,549.25 |
| 3. 1 % බදු | - |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | 114,850.00 |
| 5. වෙළඳ ස්ථාන කුළී | 95,815.00 |
| 6. වෙළඳ බලපත්‍ර ගාස්තු | 54,550.00 |
| 7. වැටුප් ප්‍රතිපූර්ණ | - |
| 8. ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු | 9,048.70 |
| 9. උසාවි දඩ මුදල් | 184,090.33 |
| 10. මුද්දර ගාස්තු | 14,238,500.00 |
| එකතුව | **39,291,454.84** |

2022 දෙසැම්බර් මස බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්. වී. නිලූක එරන්ද ගුණසේකර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

**08. <u>වෙනත් කරුණු</u>**

**<u>8.1. ටෙන්ඩර් මිළ ගණන් :-</u>**

**<u>8.1.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා වර්ණ ලිපි ශීර්ෂ හා මුද්‍රිත ලේඛන සැපයීම වෙනුවෙන් මිල ගණන් ලබා ගැනීම සඳහා මිල ගණන් ලබා ගැනීම.</u>**

ප්‍රසම්පාදනයේ නම :බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා වර්ණ ලිපි ශීර්ෂ හා මුද්‍රිත ලේඛන සැපයීම වෙනුවෙන් මිල ගණන් ලබා ගැනීම.

මිල ගණන් කැඳවූ කාල සීමාව :2022/11/29 දින ප්‍රසම්පාදන කමිටුව තීරන අංක 09 හා 10ට අදාළව තීරණයක් ගැනීම.

මිල ගණන් විවෘත කළ දිනය හා වේලාව :2023/01/13 වන දින පෙ.ව. 8.30 ට ගරු සභාපතිතුමා විසින් මාසික සභා රැස්වීමේ ආවරණ අනුමැතියට යටත්ව තීරණ ගනු ලැබීය.

2022/11/29 දින ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 09 හා 10 ට අදාළව ඉදිරිපත් කර ඇති මිල ගණන් පහත පරිදි වේ.

| ද්‍රව්‍ය / භාණ්ඩ / උපකරණ/ සේවා විස්තරය | ශ්‍රී විජය මුද්‍රණ ශිල්පියෝ , අලුත්ගම | වූ. බී. ඇඩ්වර්ටයිසින් න්ඩ් ප්‍රින්ටින්ග්, පානදූර | එස්. බී. ප්‍රින්ටර්ස් , මීගමුව |
|---|---|---|---|
| **වර්ණ ලිපි ශීර්ෂ** | 9/- | 8.90/- | (20+ vat)/- |
| **වෙළෙඳ බලපත්‍ර** | 1490/- | 1790/- | (25+vat)/- |
| **වෙළෙඳ බලපත්‍ර ලබා ගැනීමේ නිවේදන** | 2085/- | 2590/- | (25+vat)/- |
| **කර්මාන්ත බදු නිවේදන** | 2085/- | 2590/- | (25+vat)/- |
| **පැමිණීමේ ලේඛන** | 2450/- | - | (4000)/- |

අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ අලුත්ගම, ශ්‍රී විජය මුද්‍රණ ශිල්පියෝ වෙත ඇණවුම නිකුත් කළ ද වෙළඳපොළ මිල ගණන් විචලනය හේතුවෙන් එම මිල ගණන් යටතේ සිදු කළ නොහැකි බව පවසා පහත මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

| ද්‍රව්‍ය / උපකරණ / භාණ්ඩ / සේවා විස්තරය | ඒකකයක නව මිල (රු) | ඒකකයක පෙර මිල (රු) |
|---|---|---|
| **වර්ණ ලිපි ශීර්ෂ 3000ක්** | -/11.70 | -/9 |
| **වෙළඳ බලපත්‍ර 15ක්** | -/1937 | -/1490 |
| **වෙළඳ බලපත්‍ර ලබා ගැනීමේ නිවේදන 10ක්** | -/2710 | -/2085 |
| **කර්මාන්ත /ව්‍යාපාර බදු නිවේදන 10ක්** | -/2710 | -/2085 |
| **පැමිණීමේ ලේඛන 05ක්** | -/3185 | -/2450 |

2022/12/15 දින පැවති ප්‍රසම්පාදන කමිටු තීරණ අංක 15 යටතේ එම නව මිල ගණන් අනුව එම මුද්‍රිත ලේඛන බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරන ලදී.

නමුත්, එම මිල ගණන් යටතේද සිදු කළ නොහැකි බව දන්වා 2023/01/13 වන දින ඊමේල් තාක්ෂණය ඔස්සේ ලිපියක් යොමු කර තිබුණි.

බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා එම ලේඛන කඩිනමින් අවශ්‍යාව පැවතීම හේතුවෙන් දෙවනුවට මිල ගණන් ඉදිරිපත් කර තිබූ පානදූර, වූ.බී. අඩ්වර්ටයිසින් ඇන්ඩ් ප්‍රින්ටින්ග් ආයතනය වෙතින් එම මුද්‍රිත ලේඛන ලබා ගැනීම ගරු සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් තීරණය කරන ලදී.

ඉහත ඇස්තමේන්තුව අනුව බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගබඩාව සඳහා එම ලේඛන කඩිනමින් අවශ්‍යාව පැවතීම හේතුවෙන් දෙවනුවට මිල ගණන් ඉදිරිපත් කර තිබූ පානදූර, වූ.බී. අඩ්වර්ටයිසින් ඇන්ඩ් ප්‍රින්ටින්ග් ආයතනය වෙතින් එම මුද්‍රිත ලේඛන ලබා ගැනීම සඳහා ගරු සභාවේ ආවරණ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා විසින් කරන

ලද යෝජනාව ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>8.1.2. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් අංක sp ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය පැය 5000 ධාවන ක්‍රියාකාරීත්වයෙන් පසු පූර්ණ සේවාව සිදු කිරීම සඳහා මිල ගණන් ලබා ගැනීම.</u>**

ප්‍රසම්පාදනයේ නම : බෙන්තොට ප්‍රාදේශීය සභාවට අයත් අංක sp ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය පැය 5000 ධාවන ක්‍රියාකාරීත්වයෙන් පසු පූර්ණ සේවාව සිදු කිරීම

මිල ගණන් කැඳවූ කාල සීමාව : කඩිනමින් මිල ගණන් කැඳවීම

මිල ගණන් විවෘත කළ දිනය හා වේලාව : 2023/01/10 ප.ව. 3.00ට ගරු සභාපතිතුමන් විසින් මාසික සභා රැස්වීමේ ආවරණ අනුමැතියට යටත්ව විවෘත කරන ලදී.

**<u>ඉදිරිපත් කර ඇති මිළ ගණන් පහත පරිදි වේ.</u>**

| අදාල විස්තරය | මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනය | ඉදිරිපත් කර ඇති මිල ගණන් (රු.) |
|---|---|---|
| ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය පැය 5000 ධාවන ක්‍රියාකාරීත්වයෙන් පසු පූර්ණ සේවාව සිදු කිරීම (පැය 1000 සිදුකරනු ලබන පූර්ණ සේවාව) | ඇවොන්ස්මාර්ට් ඉංජිනියරින් (පුද්)සමාගම | 254,028.10 |
| | JSB ට්‍රේඩින්(පුද්)සමාගම, පන්නිපිටිය | 267,550.00 |
| | සසිඳු මෝටර්ස්,(Foton නියෝජිත), ඉඳුරුව | 249,850.00 |

ඒ අනුව, අදාල ආයතන විසින් එක් එක් අයිතමයන් සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පූර්ණ සේවාවට අවශ්‍ය සියලුම අයිතමයන් ඇතුළත් කර ඇති සිරිමල්වත්ත, කොට්ටාව, පන්නිපිටිය ලිපිනයේ පිහිටි පිහිටි JSB ට්‍රේඩින්(පුද්) සමාගම වෙතින් ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය පැය 5000 ධාවන ක්‍රියාකාරීත්වයෙන් පසු පූර්ණ සේවාව සිදු කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරීගේ නිර්දේශය ප්‍රකාරව ගරු සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් තීරණය කරන ලදී.

ඉහත ඇස්තමේන්තුව අනුව සිරිමල්වත්ත, කොට්ටාව, පන්නිපිටිය ලිපිනයේ පිහිටි JSB ට්‍රේඩින්(පුද්) සමාගම වෙතින් ZA 5151 දරණ බැකෝ යන්ත්‍රය පැය 5000 ධාවන ක්‍රියාකාරීත්වයෙන් පසු පූර්ණ සේවාව සිදු කිරීම සඳහා ගරු සභාවේ ආවරණ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු එම්. වී. නිලුක එරන්ද ගුණසේකර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව 10.40 ට ගරු මන්ත්‍රී එච්. එම්. ඩී. සුරංග ඉන්ද්‍රලාල් නිරෝෂන් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.

**8.2. ගිවිසුම් සහාගත කිරීම :-** කිසිවක් නොමැත.

**8.3. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම.**

**8.4. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම.**

**ගරු මන්ත්‍රී දේශප්‍රිය හෙලන් කුමාර මැතිතුමා**
"ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රී මණ්ඩලයෙන් ද නිලධාරී මණ්ඩලයෙන්ද මාධ්‍යවේදී මහත්මයන්ගෙන් අවසරයි. සිල්වර් ගාඩන් පන්සල සම්බන්ධ ප්‍රශ්නය විසදා ගැනීමට බැරිවෙලා තියෙනවා. මෙම පන්සලට කිහිප වතාවක්ම ස්වාමීන් වහන්සේලා වැඩම කලා. නමුත් ස්ථිරවම වැඩ කටයුතු සිදු කරමින් වැඩ සිටියේ නැහැ. බෙන්තර ශාසනාරක්ෂක බල මණ්ඩලය දැනුවත් කර ස්ථිර ස්වාමීන් වහන්සේ කෙනෙකු පත්කර ජනතාවට හිරිහැරයක් නොවන ආකාරයට කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සලසා දීමට මේ පිළිබඳව සභාවේ සාකච්ඡා කර පන්සල නිරවුල් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. සිල්වර් ගාඩන් ඉඩමේ ජනතාවට පන්සල සමඟ කටයුතු කිරීමට අවස්ථාව නොදෙන අතර පිටින් පැමිණෙන ලද පිරිසක් විසින් පන්සලට සම්බන්ධව කටයුතු සිදු කරනවා. මේ සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගන්න."

**ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා**
"සිල්වර් ගාඩන් භූමිය සභාව සතු භූමියක්. මෙම භූමිය තුල මිනිසුන්ට තම ආධ්‍යාත්මික කටයුතු සිදුකර ගැනීමට මිසක් කිසිදු පන්සලකට ලියා දෙන්න බැහැ. සිල්වර් ගාඩන් යනු සභාවේ අනුමත කරන ලද බෙදුමකින් වෙන්දේසි ඉඩම් ගෙන පදිංචි වූ මිනිස්සු ඉන්න ප්‍රදේශයක්. සභාව විසින් එම කොටස පන්සලට පූජා කර නැහැ. මිනිසුන්ගේ ආධ්‍යාත්මික කටයුතු වෙනුවෙන් එම කොටස වෙන්කරලා තියෙන්නේ. ස්වාමීන් වහන්සේ නමකට මෙය ලියවිල්ලක් ලෙස දෙන්න බැහැ. මිනිසුන්ට නිදහසේ ජීවත් වීමට අවස්ථාව සලසා දිය යුතුයි. ස්වාමීන් වහන්සේ සහ සිල්වර් ගාඩන් සමිතියේ අය කැඳවා සාකච්ඡාවක් කර පැහැදිලි කිරීමක් කල යුතුයි. සභාව මැදිහත් වී මෙය නිරාකරණය කල යුතුයි."

**ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා**
"මෙය කාලයක් සිට පවතින ප්‍රශ්නයක්. මට මේ පිළිබඳව අදහසක් තියනවා. උදාහරණයක් ලෙස කළුතර බෝධීන් වහන්සේගේ නඩත්තු කිරීම, පරිපාලනය හා ආගමික කටයුතු සිදු කරන්නේ බෝධිකාර මණ්ඩලයක් විසිනි. මෙය ප්‍රාදේශීය සභාව සතු දේපලක් නිසා ගම්වාසීන් හා එකතු වී බෝධිකාර මණ්ඩලයක් පත්කර සභාවත් මැදිහත් වී ඒකමතිකව තීරණයක් ගන්න."

**ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා**
"කළුතර බෝධිය වගේ නෙවෙයි ගමක දායක සභාවක් ඉන්නවා. පන්සලකින් බලාපොරොත්තු වන සේවාවක් තිබෙනවා. පාංශුකූලයට දානයට වඩින්න ඕන. නැත්නම් වෙනත් පන්සලකට භාර දීමට සිදු වෙනවා."

**ගරු මන්ත්‍රී අස්වින් මනුරංග සමරනායක මැතිතුමා**
"ගරු සභාවෙන් අවසරයි. මම මීට පෙර සභාවකත් මතක් කලා කහගල්ල ප්‍රදේශයට ජලය ලැබීම පිළිබඳව ජනතාව අත්සන් කරන ලද සභාවට ඉදිරිපත් කරන්න යැයි ජනතාව ඉල්ලා සිටි සංදේශයක්. මෙම සංදේශය එවන ලද රිසිට්පත වට්ස්ඇප් මාර්ගයෙන් ලේකම්තුමියට එව්වා. නමුත්, අද වන විටවත් එය ඉදිරිපත් කර නැහැ. ඊමේල්, වට්ස්ඇප් නීත්‍යානුකූලව පිළිගන්නවා. අපි එවන සංදේශයක් ඉදිරිපත් කරන්නේ නැත්නම් සභාවේ ඉඳලා වැඩක් තියනවාද? යන්න කහගල්ල ප්‍රදේශයේ ජනතාව මගෙන් විමසීම් කලා. 1989 සිට කළුතර ජල ව්‍යාපෘතිය යටතේ කහගල්ල ප්‍රදේශයට ජලය ලැබුනේ නැහැ. ජනතාවගේ ඉල්ලීම් පරිදි ක්‍රියා කිරීමට නොයෙකුත් රජයන්ට හැකියාව ලැබුනේ නැහැ. 2022

ජනවාරි පළමුවන දින මේ අවුරුද්දේවත් මෙය ක්‍රියාත්මක කරමු යැයි ප්‍රකාශ කලා. මේ සම්බන්ධයෙන් උද්ඝෝෂණයක් කලා. දුරකතන ඇමතුමට පැමිණි මාධ්‍ය වශයෙන් සහයෝගය ලබාදීම වෙනුවෙන් මාධ්‍යවේදී පිටිගල විජේසිංහ මැතිතුමාට මම මේ අවස්ථාවේදී ස්තූතිය ප්‍රකාශ කරනවා. හිරු නාලිකාවේ රතුමිනිත්තුව වැඩසටහන යටතේ මෙය ඉදිරිපත් කලා. දක්ෂිණ ජල සම්පාදන නිලධාරීන් මේ පිළිබඳව සොයා බැලීමක් කලේ මින් පසුවයි. වසර 23කට පසු කහගල්ල ප්‍රදේශයට බද්දේගම ජල ව්‍යාපෘතිය යටතේ ජලය ලබාදුන්නා. මහජන නියෝජිතයෙක් ලෙස මා ඉදිරිපත් කල මෙම ලිපිය පිළිබඳව තවමත් සොයි බැලීමක් නොකිරීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. මහජනතාව ඉදිරිපත් කල සංදේශය සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කරනවා."

- මෙම අවස්ථාවේ දී පෙ.ව 11.00 ට ගරු මන්ත්‍රී පී. කේ. සුනිල් වීරසිංහ මැතිතුමා සභාවෙන් පිටව යන ලදී.

**<u>ගරු උප සභාපති ආර්. කසුන් මහේන්ද්‍ර ද සිල්වා මැතිතුමා</u>**

"ගරු සභාපතිතුමනි, බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. නිලධාරීතුමියන්ලා හා ජනමාධ්‍යවේදී මහත්වරුන්ගෙන් අවසරයි. වසර පහකට ආසන්න කාලයක් වැඩ කටයුතු සිදු කරමින් පැමිණියා. 2018 පෙබරවාරි මැතිවරණයක් පවත්වා අප්‍රේල් 20 වන දින පළමු සභාවාරය පැවැත්වුවා. බෙන්තොට ප්‍රාදේශීය සභාව තුල කතා කරන අවසන් කතාව යැයි විශ්වාස කරනවා. මැතිවරණයක් පැමිණිය හොත් සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාට සුභ පතනවා. අපහසු කාල පරිච්ඡේදයකට මුහුණ දීමට සිදුවුනා. අප බලාපොරොත්තු වූ සමහර වැඩ කොටස් කරගැනීමට බැරි වුනා. එයට හේතුව නොසිතූ ලෙස කොවිඩ් පැමිණීමයි. මෙම සියළු ප්‍රශ්න සමඟ සංවර්ධන කටයුතු සිදුකරමින් බල ප්‍රදේශයට වැඩක් කිරීම සියළු දෙනාගේම අධිෂ්ඨානය වුනා. කෙතරම් වැඩ කරත් සෑහීමකට පත්වෙන්න බැහැ. ඒක ලෝක ස්වභාවයයි. මම කිසිම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සමඟ පුද්ගලික ආරවුලක් ඇතිකර ගත්තේ නැහැ. සියළු දෙනාගේම පරමාර්ථය ජනතාවට සේවය කිරීමයි. දේශපාලන ක්‍රමය පිළිබඳ තිබෙන කණගාටුවක් නිසා තරඟ නොකර සිටීමට මම තීරණය කලා. බල ප්‍රදේශයේ ජනතාවට සේවයක් කරන්න නව ජවයකින් වැඩ කරන්න ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා යැයි ප්‍රාර්ථනා කරනවා. සියළු දෙනාටම ජය වේවා.

**<u>ගරු මන්ත්‍රී එම්. කේ. ජැක්සන් කොට්ටහච්චි මැතිතුමා</u>**

"ගරු සභාපතිතුමා, මනුරංග මන්ත්‍රීතුමා කතා කල ජල ප්‍රශ්නය පිළිබඳවයි. මටනම් ජලය හැමදාම ලැබෙනවා. බද්දේගම ජල ව්‍යාපෘතිය නොලැබුනේ රටට ඩොලර් එකක් හෝ වැඩිවන විශාල ප්‍රමාණයක් ඉන්න කොටසකටයි. අපට පැය 5ක් ජලය දෙන්න කටයුතු කරන්න. එසේ වුවොත් බෙන්තර මිනිස්සු ස්වයංපෝෂිතයි. මේ පිළිබඳව පසුවිපරමක් සිදු කරන ලෙස සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. බෙන්තොට ප්‍රාදේශීය සභාවට අවුරුදු 25 ක අද්දැකීම් තියනවා. අපට මිනිස්සු අතරට යන්න පුළුවන්. මම මෙම ප්‍රාදේශීය සභාවට පැමිණෙන විට රජ මාවතේ වොට් හතලිහේ බල්බ් හතරයි තිබුණේ. අපේ මැදිහත්වීම තුල මිනිස්සුන්ගේ කසල දැමීමට වැඩ පිළිවෙලක් හැදුවා. ජලය නිසා මිනිස්සු අසරණතාවයට පත්වෙනවා. මරණයට, දානයට ජලය ලබාදෙන වැඩසටහන් ක්‍රියාත්මක කලා. අවසන් සභාව නොවන නිසා මම අවසන් කතාව සිදු කරන්නේ නැහැ."

**<u>ගරු මන්ත්‍රී කේ. එච්. ඒ. චමිල මහේෂ් ජයසේකර මැතිතුමා</u>**

"ගරු සභාපතිතුමනි, බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සියළුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. නිලධාරීතුමියන්ලා හා ජනමාධ්‍යවේදී මහත්වරුන්ගෙන් අවසරයි. පානීය ජලය නොමැතිවීම බෙන්තරට තියන විශාල ප්‍රශ්නයක්. දිස්ත්‍රික් නායක ගරු රමේශ් පතිරණ මැතිතුමා සමඟ දීර්ඝ සාකච්ඡාවක් සිදුකලා. ඒ අවස්ථාවේදී එතුමා මේ සම්බන්ධයෙන් ගාල්ල දිසත්‍රික්කයේ සිටින සියලුම නිලධාරීන්ට කතා කලා. ජල ප්‍රශ්නය විසදීම සඳහා ගතහැකි තීරණය ගත්තා. වැඩි කාලයක් යාමට ප්‍රථම බෙන්තර ජල ප්‍රශ්නය විසඳෙනවා. මේ සම්බන්ධයෙන් අදාල අය දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. "

2023 ජනවාරි

**ගරු සභාපති පී.ඩී.සරත් ආනන්ද මැතිතුමා**

"ගරු මන්ත්‍රීවරුනි, අද දිනට සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා, සහයෝගය ලබා දුන් ඔබ සැමට ස්තූතියි."

ප.ව 12.15 ට සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

පී. ඩී. සරත් ආනන්ද,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.

පී.ඩී.සරත් ආනන්ද
සභාපති
බෙන්තොට ප්‍රාදේශීය සභාව

55

බෙන්තොට ප්‍රාදේශීය සභාව